# දූතයා

2024 නත්තල් කලාපය

ආත්මික සඟරාව / 65 වන කාණ්ඩය





*‘ඈ කුලුදුල් පුත්‍රයා බිහි කොට රෙදිවලින් ඔතා , නවාතැන්ගෙයි ඉඩකඩ නොතිබුන බැවින් , ගව ඔරුවක බැවුවාය.* ලූක් 2:7

ක්‍රිස්තියානි රෙපරමාදු සභාව මගින් ප්‍රකාශිත සඟරාවකි.



# දේව උදහස හා විනිශ්චය

## කතු වැකිය

**(එපීස 1:1-3 )**

2024 වර්ෂයේ අවසන් වෙමින් පවතින මෙම කාර්තුවේදී දෙවියන් වහන්සේ විසින් මෙම වර්ෂය පුරා සිදු කරන ලද සියලු උපකාරයන් හා ආශිර්වාද ගැන නැවත අපි පුනරීක්ෂණය කරමු. එසේ කිරීමෙන් උන්වහන්සේගේ විශ්වාසවන්ත භාවය හා මිනිසා කෙරෙහි දක්වන ලද උන්වහන්සේගේ ප්‍රේමය හා සෙනෙහස කෙතරම් ද යන්න අපට විස්තර කළ නොහැකිය. මිනිසා සහජයෙන්ම කොඳුරන, විවේචනයට බර සහ නිතරම අසුභවාදීව සිතන ජීවියෙක් බව අපි දනිමු. එහෙත් දේව දරුවන් ලෙස සියල්ල සුභවාදීව තීරණය කරමින්,දෙවිඳුන්ගේ විශ්වාසවන්ත භාවය හා උන්වහන්සේ තමන් වහන්සේගේ සෙනඟ කෙරෙහි දක්වන ලද අනුග්‍රාහික කරුණාව හා දේව සංරක්ෂණය සම්බන්ධව ද අප සිහිකළ යුතුය.

***"සමිඳාණන් වහන්සේ වදාරණ මෙම වචන වලට සවන් දෙන්න; ලොවේ සියලුම වංශවලින් මා මැනවින් දැන හැඳින ගෙන ඇත්තේ නුඹ පමණෙකි. ඒ නිසා නුඹලා කර ඇති සියලු පාපවලට මම දඬුවම් දෙමි". (ආමොස් 3:2) .***

ඉශ්රායෙල් ජනතාව කෙරෙහි උන්වහන්සේ විසින් දක්වන ලද අසීමිත දයාව හා සෙනෙහස සම්බන්ධව මෙම පාඨයෙන් පෙන්වා දෙයි. උන්වහන්සේ එම ජනතාව මිසර දේශයේ වහල් භාවයෙන් පිටතට ගෙන ඒම ගැන නැවත මතක් කර දුන් සේක. ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ විසින් සිදු කරන ලද යාග පූජාව කරණකොට ගෙන අපව පාපයේ ශාපයෙන් සහ වහල් භාවයෙන් සම්පූර්ණයෙන් මුදා ගෙන පූර්ණ ගැලවීම අත්කර දීමද මෙයින් අපට පිළිබිඹු කරයි. ක්‍රිස්තු උපත හා නත්තල් සැමරුම සිහිකරන මෙම කාලය තුළ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ලෝකප්‍රාප්ත වීම හා උන්වහන්සේ විසින් සිදු කරන ලද යාග පූජාව සම්බන්ධව අපගේ විමර්ශනයට භාජනය කිරීම ඉතාම වැදගත් වෙයි. එබැවින් පළමුව සමිඳාණන් වහන්සේ වදාරණ වචන වලට අප සවන් දිය යුතුය. සවන් දීම යන්නෙන් අදහස් වන්නේ අපගේ මුළු හදවතින්ම එයට සවන් දීමත්, එයට නිසි ලෙස ප්‍රතිචාර දැක්වීමත්ය.

***"නිදොස් දිවියක් ගත කරන අය; සමිඳුන්ගේ ව්‍යවස්ථාව අනුව හැසිරෙන අය, භාග්‍යවන්තය. එතුමන්ගේ ශික්ෂාපද පවත්වන අය; මුළු සිතින් එතුමන් සොයන අය භාග්‍යවන්තය. එසේය ඔවුහු කිසි නපුරක් නොකරති, ඔවුහු එතුමන්ගේ මාර්ගවල හැසිරෙති".***

දෙවනුව '*'ලොවේ සියලු වංශ වලින් මා මැනවින් දැන හැඳින ගෙන ඇත්තේ නුඹ පමණකි;*" යනුවෙන් උන්වහන්සේ තම තෝරාගත් ජනතාව ගැන මතක් කර දුන් සේක. ***"ලොවේ සියලු වංශ වලින්"*** දෙවියන් වහන්සේ තම තෝරාගත් ජනතාව කෙරෙහි දක්වන ලද විශේෂත්වය මෙම වාක්‍ය කණ්ඩයෙන් පෙන්වා දෙයි. එබැවින් ඔබ විශේෂ ජනතාවකට අයත් විශේෂ පුද්ගලයෙකු බව තේරුම් ගන්න. අප විශේෂ සෙනගක් ලෙස තෝරා පත් කර ගැනීමට හේතු වූ කාරණය සහ එහි අරමුණ එපීස යැවුම් හසුනෙන් පෙන්වා දෙයි. ***"ප්‍රේමයෙන් උන්වහන්සේ ඉදිරියෙහි අපි ශුද්ධව නොකළැල්ව සිටින පිණිස ලෝකය මැවීමට ප්‍රථමයෙන් ක්‍රිස්තුස් වහන්සේ තුළ දෙවියන් වහන්සේ අප තෝරා ගත් සේක"***

අවසන් ලෙස, ***"මා මැනවින් හැඳින ගෙන ඇත්තේ නුඹ පමණකි"*** යන්නෙන්, පාපයට වැටුණු සකල මිනිස් වර්ගයා කෙරෙහි උන්වහන්සේගේ දිව්‍ය සැලැස්ම පැහැදිලි වේ. ඉශ්රායෙල් ගෝත්‍ර අතරින් ඉතා කුඩාම ගෝත්‍රය වන ජුදා ගෝත්‍රය උන්වහන්සේ විසින් තෝරා ගෙන, ඒ වංශය තුලින් ලොව මුදන ගැලවුම්කරුවාණන්ගේ සම්ප්‍රාප්තිය හා පාප නිවාරණ පූජාව ගැන අපට ඉඟියක් ගෙන දෙයි; උන්වහන්සේ අප පමණක් දැන හැඳින ගැනීම ගැන නිරහංකාරව අප සතුටු විය යුතුය. උන්වහන්සේට සියලු ආකාරයෙන්ම විශ්වාසවන්තව කටයුතු කිරීම අපගේ වගකීම යි. එහෙත් අප පසුතැවිලිව නැවත උන්වහන්සේ වෙතට නොපැමිණීමෙන් අප දඬුවමට ලක්වෙන බව අමතක නොකරමු. **දෙවියන් වහන්සේ විශ්වාසවන්ත සෙනඟක් සොයන අතර ජනප්‍රියයන් නොසොයන බව අමතක නොකරන්න.** ඔබ නිතරම උන්වහන්සේට පක්ෂපාතී වන්න, එසේ කිරීම සඳහා ඔබට උපකාරය කිරීමට, උන්වහන්සේ ශුද්ධාත්මයාණන් වහන්සේගේ මඟ පෙන්වීම ලබා දෙන සේක්වා!

***ඔබට දෙව් ආසිරි පතමු.***

## පරාජය ද ?     ජයග්‍රහණයද ?

කිතුනුවන් ලෙස අපගේ ජීවිතයට පැමිණෙන්නා වූ නොයෙකුත් අභියෝග සහ නොයෙකුත් අනපේක්ෂිත ප්‍රශ්නකාරී වාතාවරණයන් තුළදී ඇතැම් විට අපට යුධමය වාතාවරණයක් තුළ සිටින්නා වූ අත්දැකීමක් දැනෙන්නට පුළුවනි. බිය, අවිනිශ්චිතභාවය සහ විශ්වාසය හංගවීම හා බලාපොරොත්තුවක් නොමැති වීම යන්නා වූ හැඟීම් යුධමය වාතාවරණයක් සමග හට ගන්නාවූ සිතුවිලි කිහිපයකි. මෙම ලිපිය කියවනු ලබන විටදී වුවද , ඔබ ඔබගේම ජීවිතය තුළ යම් යුධමය අත්දකීමක් තුල සිටිනු විය හැකිය. සැබවින්ම ජීවිතයට පැමිණෙන්නා වූ නොයෙකුත් අමාරුකම් වලදී ලෝකයේ ජීවිකාව ගතකරන්නාවූ අන් මනුෂ්‍යයන්ට බලාපොරොත්තුවක් රහිත අවසානයක් ඇති නමුත් , දෙවියන් වහන්සේගේ දරුවන් වූ ඔබට මට යුධමය වාතාවරණයක වුවද දෙවියන් වහන්සේගෙන් වූ පිළිතුරක් උදෙසා එනම්, ජයග්‍රහණය උදෙසා තවදුරටත් බලාපොරොත්තුවක් තබාගත හැකිදැයි පිළිබඳ පැහැදිලි අවබෝධයක් තිබිය යුතුවේ.

වර්ථමානය වන විට අපට සුලභව ඇසෙන්නාවූ වචනයක් වන්නේ **"යුද්ධය"** යන්නයි. මේ දිනවල ඇතිවී පවතින්නාවූ ඊශ්‍රායලය හා පලස්තීනය අතර ගැටුමද මෙයට එක් නිදසුනකි. සැබවින්ම යුද්ධයක් යන්න කුමක්ද? රාජ්‍යයන් හෝ ජාතීන් අතර ප්‍රචණ්ඩකාරී ගැටුමක් සරලව යුද්ධයක් ලෙස අර්ථ දක්වයි. **"එහෙත් විචක්ෂණශීලීව මෙම වචනය ගවේෂණය කළහොත් යුද්ධයක් ඇතිවන පිණිස දෙපිරිසක්ම සිටිය යුතු නොවන බවත්, එය පලමුවෙන්ම ඇති වනු ලබන්නේ යම් මනුෂ්‍යයකුගේ අභ්‍යන්තරය තුල බවත් පැවසීම අසත්‍යක් නොවේ".**

එනම්, සරල උදාහරණයක් ලෙස ඔබගේ ජීවිතයේ ඔබට ගනු ලැබීමට තිබෙන්නාවූ යම් තීරණාත්මක තීරණයකදී ඔබ විසින් කළ යුත්තේ කුමක්ද පිළිබඳ දැනගැනීමට, ඔබ තුළම අරගලයක් එනම්, ඇතැම් විට යුද්ධයක් ඇති වීමට පුළුවනි. මෙය අපගේ සිතුවිලි හා මනස මුල් කර ගනු ලබමින් සිදුවන ක්‍රියාවලියකි. කෙසේ වුවත් කිතුනු ජීවිතයට සැබවින්ම මෙම යුධමය වාතාවරණයන් වැදගත් වන්නේ ඇයිද යන්නාවූ පැනයට පිලිතුරු සොයා යාම අත්‍යාවශ්‍ය වේ.

### යුද්ධය අහම්බයක් නොවෙයි.

දේව වචනයේ සඳහන් වන පරිදි, ඉශ්රායෙල් සෙනඟ දෙවියන් වහන්සේ විසින් පොරොන්දු දේශය කරා රැගෙන යාමේදී, පාරාවෝගේ වහල්භාවයෙන් ඔවුන්ව මුදවා ගැනීම උන්වහන්සේගේ සැලැස්මෙහි කොටසක්ව තිබුණි. එහෙත් මෙම පීඩාකාරී ව්‍යසනයෙන් ගැලවීමට මත්තෙන් ඔවුහු වසර 400 ක් පමණ කාලයක් වහල් භාවයේ සිටිමින් ජීවිතයේ අමිහිරි අත්දැකීම් මතින් ගමන් කරන ලදී. මෙය සැබවින්ම ඔවුන්ගේ ජීවිතවලට යුධමය වාතාවරණයකි. නමුත් අප විසින් තේරුම් ගත යුතු කරුණ වන්නේ , ඔවුන් විසින් ගත කලා වූ එම අමිහිරි අත්දැකීම, එනම් එම යුධමය අත්දැකීම දෙවියන් වහන්සේ නොදැනුවත්ව සිටිනු ලැබූ කාරණාවක් නොවන බවයි.

***"තවද ස්වාමීන්වහන්සේ කථාකොට: මිසරයේ වසන මාගේ සෙනඟගේ පීඩාව සැබවින්ම දුටිමි. ඔවුන්ගේ විධානවරුන් නිසා ඇති ඔවුන්ගේ මොරගැසීම ඇසීමි; මක්නිසාද මම ඔවුන්ගේ දුක් දනිමි"*** (නික්මයාම 3:7). අපගේ ජීවිතවලට පැමිණෙන්නා වූ නොයෙකුත් අමාරුවූ , දරාගත නොහැකි කාලසීමාවන් පිළිබඳව දෙවියන් වහන්සේ නොදැනුවත්ව සිටිනවා යැයි ඔබ සිතන්නට පුළුවනි.

එහෙත් සැබෑ කාරණාව නම් දෙවියන් වහන්සේ ඔබ ඉන්නා වූ තත්ත්වය සහ අමාරුකම පිළිබඳ හොඳින්ම දන්නා බවත්, උන්වහන්සේ එයට පිළිතුරු දීමට බලාපොරොත්තුවෙන් සිටින බවත් අප දැනගත යුතුවෙයි.

## බලාපොරොත්තුවක් තබා ගත යුත්තේ ඇයි?

සැබවින්ම පුද්ගලිකව ඔබ තුළ හෝ යම් මනුෂ්‍යයකු නිසා හෝ ඔබගේ ජීවිතයට පැමිණෙන නොයෙකුත් යුද්ධ වලදී ඔබට බලාපොරොත්තුවක් තබා ගැනීමට හැකියාවක් ඇත්ද? නික්මයාම පොතෙහි සඳහන් වන පරිදි ඉශ්‍රායෙල් ජනතාව අනුකම්පා විරහිත පාරාවෝගේ හස්තයෙන් ගලවා ගැනීම උදෙසා දෙවියන් වහන්සේ ක්‍රියා කරන ලදී. බලාපොරොත්තු විරහිත මෙම අමාරු මොහොතේ පාරාවෝගේ හස්තයට විරුද්ධව නැඟී සිටීමට ජනතාවට ශක්තියක් නොතිබුණත් ඔවුන්ට එම ශක්තිය සහ බලාපොරොත්තුව ලබා දෙනු ලැබුවේ සර්ව බලධාරි දෙවියන් වහන්සේ විසිනි. මක්නිසාද උන්වහන්සේම පාරාවෝටත් ඔහුගේ සියලුම සොල්දාදුවන්ටත් විරුද්ධව යුද්ධ කරන ලදී.

***"ස්වාමීන්වහන්සේ ඔබ සැම උදෙසා සටන් කරන සේක, ඔබ සැම නිශ්ශබ්දව සිටිය යුතුයයි සෙනඟට කීවේය."*** (නික්මයාම 14:14) .

මෙය අපගේ ජීවිතයටද පොදු වූ සත්‍යතාවයකි. ඔබ හා මා වෙනුවෙන් සටන් කරනු ලබන්නේ දෙවියන් වහන්සේය. සටන අපට අයිති දෙයක් නොව. ඔබගේ ජීවිතයේ කැළඹී ඇති වටපිටාව නිශ්චල කිරීමට සහ ඔබ වටා ඇති ප්‍රශ්නය එනම් යුධමය වාතාවරණයෙන් ඔබව නිදහස් කිරීමට දෙවියන් වහන්සේට අවස්ථාව දෙන්න. මන්ද , සටන උන්වහන්සේට අයිති බැවින් උන්වහන්සේගේ කැමැත්ත නම් අප උන්වහන්සේට ඉඩදී නිශ්චලව සිටිනු ලැබීමය. ජීවිතයේ ඇතැම් අවස්ථාවන්වලදී අප විසින් ප්‍රශ්න වලට පිළිතුරු සෙවීමට යාමට මත්තෙන් දෙවියන් වහන්සේට අප උදෙසා ක්‍රියා කිරීමට අවස්ථාව ලබා දීම සහ නිශ්චලව සිටීම කිතුනු ජීවිතයේ පරිණත ස්වභාවයයි.

## නිශ්චලවූ පරිණතභාවය


මෙය දුටු විගසම ඇතැම් විට ඔබ තරමක් දුරට තිගැස්සීමට පුළුවනි. එනම්, අප පුරුදුවී සිටින්නේ ජීවිතයට ප්‍රශ්නයක් පැමිණෙන සැම මොහොතකම එම ප්‍රශ්නය විසඳීමට උත්සාහ කිරීමයි. නමුත් ප්‍රශ්නකාරී වාතාවරණයක් තුළ දෙවියන් වහන්සේට ක්‍රියා කරන්නට ඉඩදී නිශ්චලව සිටීමට බොහෝ මනුෂ්‍යයන්ට නුපුළුවන් කාර්යයකි. ඔවුහු ක්‍රිස්තියානි ජීවිතයේ පරිණත භාවයට ඇතැම් විට විදේශීව සිටිති.

සැබවින්ම නිශ්චල වීම යනු කුමක්ද? සැබවින්ම නිශ්චල වීම යනු දෙවියන් වහන්සේ කෙරෙහි පමණක් විශ්වාසය තැබීමයි. එනම් මාගේ ශක්තිය සහ මාගේ හැකියාව පසෙකලා දෙවියන් වහන්සේ මත පමණක් විශ්වාසය තැබීමයි. මෙය තරමක් දුරට සිදු කිරීමට අමාරු යැයි හැඟෙන ක්‍රියාවක් විය හැකිය.

***"නිශ්චලවව්, මා දෙවියන්වහන්සේ බව දැනගනිව්"*** (ගීතාවලිය 46:10) .

**දෙවියන් වහන්සේට ක්‍රියා කිරීමට ඉඩ නොදී, නිශ්චල නොවන සැම මොහොතකදීම, දෙවියන් වහන්සේගේ ස්වභාවය කිමෙක්දැයි කියා තේරුම් නොගත්තාවූ ස්ථාවරයක සිටින බව මා තේරුම් ගත යුතුය.** ඔබගේ යුද්ධය දෙවියන් වහන්සේට භාරදෙන්න. සැබවින්ම උන්වහන්සේට ප්‍රේම කරන්නන්ට සහ උන්වහන්සේගේ වචනයට එකඟව කටයුතු කරනු ලබන්නන්ට උන්වහන්සේ විශ්වාසවන්ත වූ දෙවියන් වහන්සේය.

***දේව ධර්ම ශිෂ්‍ය පසිඳු මාධව.***



# ගොවියකු ජාතිය ප්‍රබෝධමත් කරයි



**ආමොස් දිවැසිවරයාගේ පොත අනුසාරයෙන් ගෙන එන බයිබල් අධ්‍යයනයේ පළමුවැන්න මෙයයි.**

***"යුක්තිය ගලා බසිනා දිය දහරක් මෙන් ද, ධර්මිෂ්ටකම නොසිඳී ගලන ගඟක් මෙන්ද පැවතිය යුතුය."(*** ආමොස් 5:24).

මෙහි ප්‍රධාන තේමාව මෙයයි. ආමොස් වනාහි තෙකෝවා ගම්වැසි එඬේරුන්ගෙන් කෙනෙකු වූ අතර, ඔහු ඉශ්‍රායෙල් දේශය සම්බන්ධයෙන් දුටු දර්ශන පිළිබඳ පැවසූ වචන මෙය වේ. මෙම දර්ශන ඔහු දුටුවේ උශ්ශියා ජුදාහිද, ජෝවාශ්ගේ පුත් ජෙරබෝවම් ඉශ්‍රායෙල්හිද රජව සිටි කාලයේදී ඇති වූ භූමිකම්පාවට දෙවසරකට පෙරය.(1 පදය)

## හැඳින්වීම

ආමෝස් නම් දිවැසිවරයා ක්‍රිස්තු පූර්ව අටවන සියවසේ මැද භාගයේ දී ඉශ්‍රායෙල් දේශයේ උතුරු රාජ්‍යයේ දිවැසිවර කාර්යයේ යෙදුනු දිවැසිවරයෙකි. එවකට රට ආර්ථික වශයෙන් බාහිරව දියුණු තත්ත්වයක පැවැතිණි. එහෙත් ඒ බාහිර දියුණුව රවටන සුළු පුහු දියුණුවක් බව ආමොස් පෙන්වා දුන්නේය. අයුක්තියත්, අසාධාරණයත්, ගසා කෑමත්, තාඩන පීඩනත්, වංකකමත් උසස් පෙළේ රජයේ නායකයන් අතර ද, ආගමික පූජකයන් අතරද, රටේ රදලයන් අතරද බහුලව පැතිරී තිබුණු බව ඔහු පෙන්වා දී ඒවාට විරුද්ධව තදින් කතා කළේය.

අයුක්තිය නිසා රට හා ජාතිය පිරිහී විනාශ වන බව ඔහු තරයේම ප්‍රකාශ කළේය. දෙවියන් වහන්සේ යුක්ති සහගත දෙවිඳුන් බැවින් අයුක්තිය, අසාධාරණකම, වංකකම යනාදිය නො ඉවසන බවත් යුක්තියට විරුද්ධව කිසිම ජාතියකට නැගී සිටින්නට බැරි බවත් ඔහු මැනවින් පෙන්වා දෙයි. මෙම පොතේ දෙවියන් වහන්සේ පිළිබඳ ඇති අදහස අති ශ්‍රේෂ්ඨය. උන්වහන්සේ වූකලී සර්ව පරාක්‍රම, සර්ව සාධාරණ, යුක්තිගරුක, සියල්ල තීන්දු කරන දෙවියන් වහන්සේය. මේ ශ්‍රේෂ්ඨ අදහස අනුව ඔහු ගෙන එන පණිවිඩය නම් **"යුක්තියට පිටුපෑම දෙවියන් වහන්සේට පිටුපෑමකි"**.එයින් පුද්ගලයන්ටත්, ජාතීන්ටත්, දේව තීන්දුවේ ප්‍රතිවිපාක ඇතිවෙයි. **"යුක්තියට ගරු කිරීම උන්වහන්සේට ගරු කිරීමකි".** එයින් ඇතිවන ප්‍රතිඵලය ඉමහත්ය.

## ඓතිහාසික පසුබිම

ආමොස් දිවැසිවරයා ජුදාහි දකුණු රාජ්‍යයෙහි තෙකෝවාහි විසූ අත්තික්කා වැවූ ගොවියෙකි. උතුරු රාජ්‍යය වර්ෂ 170 කට පෙර ජුදා රාජ්‍යයෙන් වෙන්ව ස්වාධීනව පාලනය කළ ප්‍රදේශයකි. ඔහු තම රැකියා වශයෙන් දිවැස් වැකි කියන දිවැසිවරයෙක් නොවීය. **"මම ගොපල්ලෙක්මි, අත්තික්කා වගා කරන්නෙක්මි"**යි ඔහු පවසයි. ***''එහෙත්, සමිඳාණන් වහන්සේ එඬේර රැකියා වෙන් පිටතට මා කැඳවා 'නුඹ ගොස් මාගේ ඊශ්‍රායල් සෙනඟට දිවැසි වැකි දෙසන්න' යි මට නියම කළ සේක." (7:15) ඔහු පවසයි.***

තෙකෝවා නගරය කි.මී. 25 පමණ ජෙරුසලමට දකුණින්ද, හෙබ්‍රොන්ට ඊසාන දිග ප්‍රදේශයටද සමදුරකින්ද පිහිටියේය. රෙහෙබෝවම් විසින් එම නගරය ආර්ථික නගරයක් ලෙස පිහිට වූ බව 2 ලේකම් 11:5 හි සඳහන්වේ. ඔහු මෙහි බලකොටු සවිකර, එහි අධිපතීන් පත්කොට ඒවායේ ආහාර සහ තෙල්ද මුද්‍රික පානද රැස්කොට තැබීය. තවද ඔහු එම නගර ඉතා බලවත් ලෙස ශක්තිමත් කළ බව වාර්තා වේ.

## ආගම ගැන දෙවියන් වහන්සේගේ අදහස

ආමොස් තුමා විසින් බොහෝ ආගම් හා නමස්කාරයන් සම්බන්ධව කතාකරයි. සෙනඟ නොකඩවා නමස්කාරය පිණිස බොහෝ විට සිද්ධස්ථාන කරා ගොස් තිබේ. ***"එහෙත් නුඹලාගේ මංගල්‍ය වලට මම ද්වේශ කරමි. ඒවා මට රුස්සන්නේ නැත. නුඹලා යාග පූජා ද, ආහාර පූජා ද මට ඔප්පු කරන නමුත් මම ඒවා නොපිළිගන්නෙමියි දෙවියන් වහන්සේ වදාළ සේක."(5:21)*** එයට හේතු කාරණා වූයේ , ඔවුන් යුක්තිය නොපිට පෙරලෙන, මානව අයිතිවාසිකම් වළක්වන ජනතාවක් වීමයි.

***'තවද ඔබේ පව් කොපමණ බරපතලද කියාත්, ඔබේ අපරාධ කොපමණ බහුලද කියාත් මම දනිමි. නුඹලා දමිටුන්ට පීඩා කරන්නහුය; අල්ලස් ගෙන, උසාවිය මගින් යුක්තිය ඉටු කර ගැනීමට දුප්පතුන්ට ඉඩ නොදෙන්නහුය.''*** (12 පදය).

ඔවුන් බාහිරව තම ආගමික චාරිත්‍ර හා වත්පිළිවෙත්වල අකුරටම ක්‍රියාවෙහි යෙදුනද, ඔවුන් තුල පැවති අධ්‍යාත්මික බංකළොත්භාවය මෙලෙස දෙවියන් වහන්සේ තවදුරටත් පෙන්වා දුන් සේක. නිවැරදි ආකල්පවලින් තොරව සිදුකරනු ලබන වත්පිළිවෙත් හා නමස්කාරයන් නිශ්ඵල වන අතර, දෙවි සමිඳාණන් ඉදිරියේ ඒවා පිළිකුල් සහගත බව තේරුම් ගත යුතුය. ***දෙවියන් වහන්සේ වෙත හැරී යන්න. ගොස් ජීවත්වන්න. නොගියොත් උන්වහන්සේ ගින්නක් මෙන් ජෝසෙප්ගේ වංශය පිට පැමිණෙන සේකැයි*** (5:6) . තවදුරටත් උන්වහන්සේ අවවාදාත්මක පවසන සේක.

***පොතෙහි සැලැස්ම***

1. පරිච්ඡේද 1:1- 2:5 දක්වා ඊශ්‍රායෙල් දේශය අවට ජාතීන් පිළිබඳ දේව විනිශ්චය.
2. පරිච්ඡේද 2:6 - 6:14 දක්වා ඊශ්‍රායෙල් ජාතිය පිළිබඳ දේව විනිශ්චය.
3. පරිච්ඡේද 7:1- 9:15 දක්වා ආමොස් තුමා දුටු දර්ශන පහ.

***ලබන කලාපයෙන් දෙවැනි කොටස පිළිබඳ සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වෙමු - කතෘ.***



## සියවස් හතරක් කරා පියනගමින් යන ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි රෙපරමාදු සභාව

ක්‍රිස්තු වර්ෂ 1642 ඔක්තෝබර් මස 6 වන දින ශ්‍රී ලංකාවේ දකුණු පුරවරයේ ගාල්ලේදී පළමු ප්‍රතිසංස්කෘත (රෙපරමාදු) කිතුණු සභාව ආරම්භවූ බව ඉතිහාසය වාර්තා කරයි. එය ඕලන්දයේ (නෙදර්ලන්තයේ) උක්රේට්හි ගෞරවනීය අන්තෝනියස් හෝන් හෝවියස් දේවගැති තුමා නිළ වශයෙන් ශ්‍රී ලංකාවේ රෝපණය කලේය. වර්ෂ 2024 වසරට රෙපරමාදු සභාව වර්ෂ 382 පසු කරමින් 383 වසරට පා තැබීම ගැන ලෝකාග්‍ර දෙවි සමිඳාණන් වහන්සේට පළමුව ස්තුති පුදමු. මෙම සභාව ශ්‍රී ලංකා භූමියේ බිහිවූ පළමු ප්‍රොතෙස්තන්ත (බයිබලීය) නිකායයි. මෙම නිකායේ ආරම්භය හා වර්තමාන ප්‍රගතිය සම්බන්ධව මෙම ලිපියෙන් ඔබ වෙත ගෙන ඒමට බලාපොරොත්තු වෙමු.

### ඉතිහාසයෙන් බිඳක්

දහසයවන සියවසයේ යුරෝපයේ ඇතිවූ රෙපරමාදු ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය නිසා කතෝලික සභාවෙන් වෙන්වූ සභාවකි ඕලන්ද රෙපරමාදු සභාව. ඔවුහු ජෝන් කැල්වින් නම් වූ දේව ධර්මාචාර්යවරයාගේ ප්‍රතිසංස්කරණ අදහස් අනුව මෙම ක්‍රිස්තියානි ශාසනය සකස් කර ගත්හ. ප්‍රෙස්බිටීරියාණු ක්‍රමය හෙවත් කිතුණු සභාවේ ජේෂ්ඨ සභා මූලිකයන් (එල්ඩර්වරු) හා දේව ගැතිවරුන්ගෙන් සමන්විත පාලනයක් යටතේ රෙපරමාදු සභාව පාලනය වේ. ශුද්ධ බයිබලය ඔවුන්ගේ ඇදහිල්ලේ මූලික පදනම ලෙස පිළිගත් අතර ආත්මික විමුක්තිය පිළිබඳව දෙවියන් වහන්සේ විසින් මිනිස් උපතට පෙර තීරණය කිරීමක් ගැන විශ්වාස කෙරේ.

14 වන සියවසේ සැලකිය යුතු කාලයක් පෘතුගාලයේ ඔටුන්න ස්පාඤ්ඤයේ රජ පවුලට හිමිවීම නිසා ස්පාඤ්ඤයට විරුද්දව ඕලන්දය නිදහස සඳහා සටන් කළෝය. එහි ප්‍රතිඵලයක් ලෙස ලංකාවේදී ද පෘතුගීසීන්ට විරුද්ධ කමක් පෙන්නුම් කලෝය. මෙයට දේශපාලනමය හේතුද ඇතිවූ බව සඳහන් කළ යුතුය. එසේම එකල ඕලන්ද රෙපරමාදු සභාව නිරන්තරයෙන්ම පෙරදිග ප්‍රදේශවලදී රජයේ බලපෑමට හා අධීක්ෂණයට යටත් විය. ක්‍රි.ව. 1618 - 1619 දී ඩෝර්ට් හි පැවති සිනොඩ් සභාවේදී කැල්වින් වාදය ඕලන්දයේ ස්ථාවර ලෙස ජයග්‍රහණය කළේය. ලංකාව ඕලන්දවරුන් පාලනය කළේ ක්‍රිස්තු වර්ෂ 1638 ගාල්ල, 1658 කොළඹ , 1796 දක්වා එම කාලය තුළය.

## ඕලන්ද වෙළෙඳ සමාගමේ විදේශීය ආගමික පිළිවෙත්

මුල් රෙපරමාදු නායකයන් විදේශීය රටවල ධර්මය ප්‍රචාරය ගැන කල්පනා කළේ නැත. ඕලන්ද වෙළඳ සමාගම විසින් සියවස් දෙකක් තුළ පූජකවරුන් දහසක් පමණ ද ,ගිහි නායකයන් හා පාසල් ගුරුවරු තවත් දහස් ගණනක් ද පෙරදිගට එවා ඇත. පාසල් හා දේවස්ථාන ගොඩනැගීම සඳහා මුදල් ද සමාගම විසින් සපයන ලදි. පූජකයන්ට හා වෙනත් ශාසනික නායකයන්ට වේතන ගෙව්වේ ද වෙළඳ සමාගමෙනි.

එසේ වුවද දක්ෂ පූජකවරු පෙරදිග සේවය සඳහා ලබා ගැනීම අසීරු විය. තවද ඕලන්ද පූජකවරුනට දේශීය භාෂා ඉගෙන ගැනීමට අවස්ථාව ලැබීමද අපහසු වූයේ, සමාගමේ නිලධාරීන් ගේ මනාපය අනුව ප්‍රදේශයෙන් ප්‍රදේශයට මාරුකර හැරවූ නිසාවෙනි. පූජකවරුන්ගේ හිඟකම ඕලන්ද පාලන සමයේ ලක්ෂණයකි. 1647 දී ආසියාවේම ඕලන්ද පාලන ප්‍රදේශවල සිටි පූජකවරුන්ගේ සංඛ්‍යාව විසි අටකි.

## ශ්‍රී ලංකාවේ ඕලන්ද ක්‍රිස්තියානි සභාව

ලංකාවේ කැල්වින් වාදය මතුපිටින් පෙනුන ආකාරයට සාර්ථක විය. 1958 පමණ ලියන ලද ඕලන්ද වාර්තාවල සඳහන් අන්දමට පන්ලක්ෂයක් පමණ කතෝලික පිරිස කැල්වින්වාදීන් බවට හැරවීම සිදුවිය. තවද කිසි කලෙක එකවර ප්‍රෙඩිකාන් හෙවත් ඕලන්ද පූජකවරු දහයකට වැඩි සංඛ්‍යාවක් මෙරට නොවූහ. පිළිප්පුස් බාල්දියස් වැනි දෙමළ ඉගෙන ගත් පූජකවරයෙකු හෝ ජොහානිස් රුවෙල් වැනි සිංහල උගත් පූජකවරු වූයේ ඉතා කලාතුරකිනි. එකල ඕලන්ද ක්‍රිස්තියානි සභාව පාලන කටයුතු සඳහා පාලන මණ්ඩල හතරකට බෙදා තිබුණි. එනම් ගාල්ල,කොළඹ, මන්නාරම සහ යාපනය විය.

## අධ්‍යාපනය

ආගමික අදහස් කුඩා කාලයේ සිට ඉගැන්වීම අවශ්‍ය නිසා අධ්‍යාපනයේ වැදගත්කම ඕලන්දවරු තේරුම් ගත්හ. ඕලන්ද පාලනය ආරම්භ වන විට යාපනයේ පාසල් හතරක්ද ගාල්ලේ 23, මන්නාරමේ 14 ක් විය. යාපනයේ පමණක් සිසුන් 20,000 ක් ඉක්මවා සිටියහ. තවද ඕලන්ද යුගයේ පාසල් වර්ග පහක් දක්නට ලැබුණි. මූලික අධ්‍යාපනය පමණක් සපයන ලද දේශීය පාසල් අධික විය. දේව ධර්ම ශාස්ත්‍රාල හා උසස් පාසල් ද විය. අනාථ පාසල් තුන්වැන්නය. හතරවැන්න යුරෝපීය ළමුන් සඳහා වූ ඕලන්ද පාසල්ය. වහලුන් සඳහා වූ පාසැල් පස්වැන්න ලෙස දැක්විය හැකියි.

## රෙපරමාදු සභාව හා දේව ධර්ම ශාස්ත්‍රාල.

ක්‍රිස්තු ධර්මය දේශීයයන් අතර ස්ථාවර වීම සඳහා දේශියයන් ලවා ඉගැන්වීමට ඕලන්දයෝ ක්‍රියා කළහ. 1687 දී දේවධර්ම ශාස්ත්‍රාල දෙකක් කොළඹ හා යාපනයේ ඇරඹීමට ඕලන්ද වෙළඳ සමාගම තීරණය කළේය. යාපනයේ ශාස්ත්‍රාලය 1690 දී ආරම්භ විය. මුලදී එයින් සේවය සැපයුවේ කොළඹ ගාල්ල හා මාතර දිස්ත්‍රික්කවලටය. ප්‍රධානාචාරවරයා නිරන්තරයෙන්ම ඕලන්ද ජාතිකයෙක් විය. මෙම තනතුරු දැරූ පූජකවරු බොහෝ දෙනෙක් මෙරට ක්‍රිස්තු ධර්මය සඳහා විශාල සේවයක් කර ඇත. ප්‍රථම ප්‍රධානාචාර්යවරයා වූ ජොහානිස් රුවෙල් සිංහල භාෂාව හා ව්‍යාකරණය ගැන පොතක් රචනා කලේය. 1740 සිට යුරෝපීයයන් පවා කොළඹ දේව ධර්ම ශාස්ත්‍රාලයේ අධ්‍යාපනය ලැබුවෝය. බයිබලේ ඉගැන්වීමේ දී ග්‍රීක නව ගිවිසුම භාවිතා විය. ප්‍රසිද්ධ ලතින් පොත් ද මෙහි සිසුන් විසින් පරිහරණය කරන ලදි.

1758 දී හෙබ්‍රෙව් භාෂාව සඳහා වෙනම ගුරුවරයෙක් විය. සෙමනේරිය ඕලන්ද අධ්‍යාපන පද්ධතියේ ඉහළම පුරුක විය. ශුද්ධ ලියවිලි පරිවර්තනය, පිටපත් කිරීම හා වෙනත් ඇදහිලි ප්‍රකාශ දේශීය භාෂාවලින් සකස් කිරීම සම්බන්ධයෙන් මෙම සෙමනේරියේ ගුරුවරු මහඟු සේවයක් කර ඇත.

## මුද්‍රණ යන්ත්‍රය ;

සිංහල අකුරු සහිත මුද්‍රණ යන්ත්‍රයක් මුලින්ම 1736 දී කොළඹ පිහිටුවන ලදි. ක්‍රිස්තියානි චින්තනය දේශයන්ට ඔවුන්ගේම භාෂාවෙන් ලබාදීම මෙහි අරමුණ විය. 1736 සිට බයිබලය සිංහල සහ දෙමළ භාෂා වලින් මුද්‍රණය කිරීමට උනන්දුවක් ඇති විය. 1739 දී දෙමළ, සිංහල ,පෘතුගීසි යන භාෂා තුනෙන් අලුත් ගිවිසුම සකස් කිරීමටද සැලැස්මක් විය.විල් හෙල්මුස් කොනයින් නම් පූජකවරයා විසින් 1711 දී මතෙව්, මාක්, ලූක් සුභාරංචි සිංහලට පරිවර්තනය කර ඕලන්ද ආණ්ඩුකාරයා වූ හෙන්ඩ්‍රික් බේකර්ට ප්‍රධානය කළේය. මේ හැර විට්සෙලියස් නම් පූජකවරයෙක් ද සිංහල බයිබල් පරිවර්තන කටයුතුවල නිරත වූයේය. ඊට පසු නව ගිවිසුමේ ඉතිරි කොටස් ද පරිවර්තනය විය. සිමොන් කාට් නම් පූජකවරයාගේ අනුග්‍රහය හා අනුදැනීම ඇතිව මෙම කටයුතු කරන ලදී.

මෙයට අමතරව ඕලන්දවරුන් ශ්‍රී ලංකා සංස්කෘතිය හා ජන සමාජයට අගනා බොහෝ දෑ දායාද කොට දුන්හ. වර්තමානය දක්වා පවතින රෝම ලන්දේසි නීති පද්ධතියද, ප්‍රවාහනය හා සන්නිවේදනය පහසු කරනු සඳහා ඇලමාර්ග, කැටයම් කලාව, මුද්‍රණ ශිල්පය හඳුන්වාදීම, පාසල් පද්ධතිය ආරම්භ කිරීම, ආරෝග්‍යශාලා, උප්පැන්න මරණ හා විවාහයන් ලියාපදිංචි කිරීම යන පොදු සමාජ සේවාවන් බොහොමයක් ආරම්භ කර තිබේ. හැඳළ ප්‍රදේශයේ ලාඩුරු රෝහල විවෘත කිරීමද ඔවුන් විසින් සිදුකරන ලද අගනා සේවයකි.

2024 ඔක්තෝම්බර් 6 දිනට ශ්‍රී ලංකා ඕලන්ද රෙපරමාදු සභාවට වසර තුන්සිය අසූ දෙකක් සම්පූර්ණ කරයි. සිංහල දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශවල ජනවන්දනා කටයුතු වර්තමානයේදී සිදුවෙමින් පවතී. මාතර ,ගාල්ල, කොළඹ ආදරුප්පු වීදිය හා කල්පිටිය ප්‍රදේශවල පිහිටි ඕලන්ද යුගයට අයත් දේවස්ථාන තවමත් ඉතාම හොඳ තත්ත්වයේ පසුවීම ඕලන්ද සමය සිහිකරවයි. යාපනය මන්නාරම් ප්‍රදේශයන්හි පිහිටි නටඹුන් තත්ත්වයේ පසුවන දේවස්ථාන ප්‍රතිසංස්කරණය කොට ජන වන්දනාවට යොමු කිරීම වර්තමාන ප්‍රජාවගේ වගකීමකි. SPES EST REGAMINAT යන ලතින් භාෂාවෙන් සඳහන් රෙපරමාදු සභාවේ ආදර්ශ පාඨය (MOTTO) අපට මහත් බලාපොරොත්තුවක් ගෙන දෙයි. **"මක්නිසාද ගහක් කපා දැමුවහොත් ඒක දෙවනුව ලියලා එහි රිකිලි හට ගන්නේය. යන බලාපොරොත්තුව ඇත්තේය."** (යෝබ් 14ඃ 7 ). එය යළිත් ලියැලෙන්නේය යන බලාපොරොත්තුවයි. අප එක්ව තවදුරටත් ජීවමාන දෙවිඳුන්ට ස්තුති කරමු.

***කතෘ***

ගෞ.එස්. ඊ. ජේබර් දේවගැති තුමා

***උපුටා ගන්නා ලද මූලාශ්‍ර:-***

ශ්‍රී ලංකා ක්‍රිස්තියානි ඉතිහාසය -මහාචාර්ය ජී.වී.පී. සෝමරත්න

පියවරුන්ගේ ඇදහිල්ල- සී.ඩී. ප්‍රැන්සිස්කස්


ලන්දේසි ලංකා පොත- ආර්. එල්.බ්‍රොහියර්

(ගීතාවලිය 100 :1 - 5 ) ***තුති දීමේ ගීතයකි***

***මුළු පොළෝ වැසියෙනි, සමිඳුන් හට ප්‍රීති ඝෝෂා පවත්වන්න. සමිඳුන් හට ප්‍රීතියෙන් වැඳ පුදා, ප්‍රීති ගී ගයමින් එතුමන් ඉදිරියට පැමිණෙන්න. සමිඳාණන් දෙවිඳුන් බව දැනගන්න. අප මැව්වේ එතුමාණෝය. අපි එතුමන්ගේය. එතුමන්ගේ සෙනඟය. එතුමන්ගේ තණ බිම්වල බැටළුවෝය. තුති පුදා, එතුමන්ගේ වාසල් දොරටුවලටද තුති ගී ගය ගයා එතුමන්ගේ මන්දිරවලටද ඇතුළු වන්න. මන්ද, සමිඳාණෝ යහපත්ය. එතුමන්ගේ ප්‍රේමය ස්ථිරය. සදහටම පවත්නේය.පරපුරෙන් පරපුරට එතුමන්ගේ විශ්වාසවන්තකම පවත්නේය.***



# ළමා පිටුව



## ඒ ලස්සන - නත්තල් කථාව

පුංචි දුවේ පුතේ, අපි දැන් ටික ටික ළං වෙමින් ඉන්නේ නත්තල් කාලයටයි. ඉතිං ඔයාලා හැමෝම හරි හරියට කාර්ය බහුල වෙන කාලයක් තමයි මේ කාලය. ඉරිදා පාසලේ වැඩ, පල්ලියේ වැඩ, ගෙදර සරසලා සූදානම් කරන කටයුතු. එහෙම නේද? ඉතිං මේ විදිහට අපි නත්තල සමරන්න මොනවද කරන්නේ? හිතන්න බලන්න......

අපි නත්තල් ගස් හදනවා. ගවලෙන් හදනවා. ම්ම්...... තව නත්තල් කේක් එහෙමත් හදනවා නේද? ඒ විතරක්ද තෑගි බෙදා හදා ගන්නවා. අලුත් ඇඳුම් ඇඳලා පල්ලි යනවා. කැරොල් ගීතිකා කියනවා. තව තව කොච්චර දේවල් කරනවද මේ නත්තල් කාලෙදී නේද?

ඉතිං මේ හැම දෙයක්ම අතර ඔයාලා දන්නවද නත්තලේ සැබෑ තේරුම මොකද්ද කියලා? මනුෂ්‍යයාට තියෙන ආදරය නිසාම දෙවියන්වහන්සේ තමන්ගේ එකම පුත්‍රයා වුණ ජේසුස් ක්‍රිස්තුස්වහන්සේව මේ ලෝකයට එව්වා. මනුෂ්‍යාව වරදින්, පාපයෙන් නිදහස් කරගෙන, සදාකාල ජීවනය ලබා දෙන්නයි එහෙම කළේ. ඒ වෙනුවෙන් ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ බිලිඳු දරුවෙක් වගේ මේ ලෝකයේ උපත ලැබීම තමයි අපි නත්තල කියලා සමරන්නේ.

දෙවියන්වහන්සේ ලෝකය සහ මනුෂ්‍යාව මවලා මේ ලෝකයේ පාලනය ඔවුන්ට භාර දෙනවා. ආදම් සහ ඒව කියන්නේ ලෝකයේ මුල්ම මනුෂ්‍යයින් දෙදෙනායි. ඉතිං මේ ආදම් සහ ඒව දෙවියන්වහන්සේ එපා කියපු දේ කරලා, දෙවියන්වහන්සේට අකීකරු වෙනවා. එහෙම තමයි පාපය ලෝකයට ඇති වුණේ. මේ පාපයේ අයහපත් ප්‍රතිපල දිගින් දිගටම මිනිසාට විඳින්න සිද්ධ වුණා. ඉතිං දෙවියන්වහන්සේ වරින් වර අනාගතවක්තෘන් තුළින් මනුෂ්‍යාට හරි මාර්ගය මඟ පෙන්වන්න ක්‍රියා කළා. නමුත් මිනිසා නැවත නැවතත් පාපයට යොමු වුණා. මේ පාපයෙන් මනුෂ්‍යාව ගලවා ගන්න ගැළවුම්කාරයෙක් මේ ලෝකයට එනවා කියලා ජේසුස් වහන්සේ උපදින්න අවුරුදු ගණනාවකට කලින් අනාගතවක්තෘවරු, අනාගතවාක්‍ය කියලා තිබුණා. යෙසායා, මීකා, සෙකරියා වගේ දිවැසිවරුන් මේ අතර සිටිනවා. ඒ අනාගතවක්තෘන් ප්‍රකාශ කළ අනාගත වාක්‍ය කිහිපයක් අපි දැන් බලමුකෝ. යෙසායා අනාගතවක්තෘ තුමා යෙසායා 9:6 පදේ මෙහෙම කියනවා.

***"අපට ළදරුවෙක් උපන්නේය. අපට පුත්‍රයෙක් දෙන ලද්දේය...... උන්වහන්සේගේ නාමය අපූර්වය. ..... සමාදානයේ කුමාරයාණෝයයි කියනු ලබන්නේය".***

උපත ලබන්න යන ජේසුස් වහන්සේගේ ශ්‍රේෂ්ට බව ගැන ඒ විදිහට කියන යෙසායා තුමා මෙහෙමත් කියනවා.

***"එබැවින් උන්වහන්සේම නුඹලාට ලකුණක් දෙන සේක. බලව, කන්‍යාවක ගර්භණීව පුත්‍රයෙකු වදා එම්මානුවෙල් යන නම ඔහුට තබන්නීය"*** (යෙසායා 7:14). ඒකෙන් අදහස් වෙන්නේ ජේසුස් වහන්සේ කන්‍යවකගේ කුසින් බිහි වෙන්නට යන බවයි. මීකා දිවැසිවරයා අනාගත වැකියක් කියමින් (මීකා 5:2) සඳහන් කරනවා, උන්වහන්සේ උපත ලබන්නේ බෙත්ලෙහෙමේ බව.

***"එම්බා බෙත්ලෙහෙම් එප්‍රාතා. ජුදාගේ දහස් ගණන් අතරෙහි සිටීමට කුඩාව සිටින නුඹෙන් ඉශ්‍රායෙල් කෙරෙහි ආණ්ඩුකාරයා වීමට මා වෙතට කෙනෙක් නික්ම එන්නේය".***

ඉතිං උන්වහන්සේගේ උපතට බොහෝ කාලයකට පෙර ප්‍රකාශ වුණු මේ අනාගත වාක්‍ය හැම එකක්ම උන්වහන්සේගේ උපතත් එක්ක ඒ විදිහටම ඉටු වුණා. ඉන්නකෝ මම කියලා දෙන්නම් ඒ කොහොමද කියලා. ජේසුස් වහන්සේගේ අම්මා තමයි මරියා. ඇය ජෝසෙප් කියන තරුණයා සමග විවාහ වෙන්නයි හිටියේ. විවාහ වෙලා හිටියේ නෑ. දෙවියන්වහන්සේ ඇයව තෝරාගන්නවා ජේසුස් වහන්සේගේ මව විදිහට. මරියා කියන්නේ බොහෝම ගුණ යහපත් තරුණියක්. දෙවියන්වහන්සේගේ කැමැත්ත කරන්න පැකිලීමක් නැතිව යටහත් වුණා. ගාබ්‍රියෙල් දේව දූතයා ජේසුස් වහන්සේගේ උපත ගැන පණිවිඩය මරියාට දැනුම් දුන්න අවස්ථාවේ ඇය මෙහෙම කියනවා, මරියා ද ***'බැලුව මැනව, ඔබගේ වචනය ලෙස මට වේවායි කීවාය".*** (ලූක් 1:38).

ඒ වගේමයි ජෝසෙප්. දේව භය තිබුණ යහපත් මනුෂ්‍යයෙක්. දෙවියන්වහන්සේ කිව්ව විදිහටම ජෝසෙප් විසින් මරියාව සහ ජේසුස් වහන්සේව ඉතා හොඳින් රැකබලා ගන්නවා. ඉතිං කීකරු දරුවන් විදිහට අපේ ජීවිතයෙත් අපි දේවභය ඇති උන්වහන්සේගේ කැමැත්ත කරන දරුවන් වෙන්න උත්සාහ කරන්න ඕනේ. මරියා සහ ජෝසෙප් මේ සඳහා අපට සපයන්නේ හොඳ ආදර්ශයක්.

මේ අය ජීවත් වුණේ ගලීලයේ නාසරෙත් නුවර. නමුත් සංගණනයක් පැවැත්වුණ නිසා ජෝසෙප් සහ මරියාට දාවිත්ගේ නුවර, තවත් විදිහකට කියනවා නම් බෙත්ලෙහෙමට යන්න සිද්ධ වුණා. මේ කාලය ජේසුස් වහන්සේගේ උපත සිද්ධ වෙන්න බොහෝම ආසන්නවයි තිබුණේ. ඉතිං ඔවුන් එසේ යන අතර මරියා ජේසුස් වහන්සේව බිහි කරන්න සූදානම් වුණා. ඔවුන්ට නවතින්න කිසිම නවාතැනක ඉඩක් තිබුණේ නැහැ. පුංචි ජේසුස් වහන්සේ ඉපදුණාම තබන්න තැනක්වත් තිබුණේ නෑ. ඒ නිසා ඔවුන් ගවයන් කන ඔරුවක පුංචි ජේසුස් වහන්සේව තැබුවා. ඒ විදිහට ජේසුස් වහන්සේ බෙත්ලෙහෙමේ දී උපත ලැබුවා. ජේසුස් වහන්සේ ඉපදුණු පණිවිඩය දේවදූතයන් මුලින්ම කියන්නේ එඬේරුන්ට. දේවදූතයා ඔවුන්ට කථාකොට:


***'භය නොවෙන්න: බලව, මුළු සෙනඟට මහත් ප්‍රීති උපදවන යහපත් ආරංචි නුඹලාට ගෙනෙමි. මක්නිසාද ස්වාමීවූ ක්‍රිස්තුස් නම් ගැළවුම්කාරයෙක් නුඹලාට දාවිත්ගේ නුවර අද උපන්සේක. රෙදිවලින් ඔතා ගවයන් කන ඔරුවක බාවා ඉන්න ළදරුවෙක් නුඹලාට සම්බවන්නේය. මේක නුඹලාට ලකුණයයි කීවේය".*** (ශු. ලූක් 2:10-12) එඬේරු කියන්නේ ඒ කාලේ සමාජයේ සාමාන්‍ය ජන කොටසක්. පිළිගැනීමක් තිබුණේ නෑ. ධනවතුන්, බලවතුන් නෙවෙයි. දේවදූතයන් එඬේරුන්ට පළමුවෙන්ම ඒ පණිවිඩය දැනුම්දීම තුළ සමාජයේ උස් පහත් සියලුදෙනාට ජේසුස් වහන්සේ වෙත ළඟා වීමේ පුළුවන්කම තියෙනවා කියලා අපට පෙන්වනවා. උන්වහන්සේ දුප්පත් පෝසත්, උසස් පහත් බේදයක් සැළකවේ නෑ. හැම කෙනෙක්වම එක වගේ පිළිගත්තා. ඒ නිසා තමයි ඔයාටත් මටත් අද දෙවියන්වහන්සේගේ දරුවන් වෙන්න පුළුවන්කම ලැබුණේ. අනික් වැදගත්ම කාරණාව තමයි ජේසුස් වහන්සේ රජුන්ගේ රජතුමා. නමුත් උන්වහන්සේ උපත ලැබුවේ රජ මාළිගාවක නෙමෙයි. සාමාන්‍ය තැනක. උන්වහන්සේ ජීවත් වුණේ සාමාන්‍ය පවුලක දරුවෙක් විදිහටයි. රජමාළිගාවක රජෙක් වගේ උපත ලැබුවා නම්, ජීවත් වුණා නම්, උන්වහන්සේට ළං වෙන්න සාමාන්‍ය මිනිස්සුන්ට බැරි වෙනවා. නමුත් ජේසුස් වහන්සේ වෙත ළං වෙන්න කාටවත් බාධාවක්, සීමාවක් තිබුණේ නැහැ. අසනීප අයව, සමාජයෙන් කොන් කරනු ලැබූ අයව, දරුවන්ව ජේසුස් වහන්සේ ඉතාමත් ආදරයෙන් පිළිගත්තා.

ජේසුස් වහන්සේ උන්වහන්සේගේ ජීවිත කාලය පුරාම පුදුම වූ හාස්කම් කළා. මනුෂ්‍යයන්ට උපකාර කළා. දේව රාජ්‍ය ගැන, සදාකාල ජීවනය ගැන දේශනා කළා. අවසානයේ කුරුසියක ජීවිතය පූජා කළා. ජේසුස් වහන්සේ මේ ලෝකයට පැමිණියේ තමන්ට කුරුසියක් මත ජීවිතය පූජා කරන්න සිදු වෙන බව දැනගෙනමයි. නත්තල අපට වැදගත් වෙන්නේ අන්න ඒ නිසයි. ජේසුස් වහන්සේ තමන්ට හිමි සියල්ල අතහැරලා, දුක වේදනාව විඳින්න මනුෂ්‍යයෙක් විදිහට මේ පොළොවට ආවා.

ඉතිං දුවේ පුතේ, නත්තලේදී අපි හුඟාක් දේවල් කරනවා. හැබැයි දුවේ පුතේ මේ දේවල් අතර නත්තල කියන්නේ ජයටම සමරන තවත් එක දවසක් එක සැමරුමක් විතරක් නෙමෙයි. නත්තලේදී අපි අපේ ජීවිත දිහා ආයේ හැරිලා බලන එක තමයි වැදගත්ම දේ. අපේ ජීවිතයේ ජේසුස් වහන්සේට තියෙන්නේ මොනවගේ තැනක්ද? අපි අපේ වැරදි වලට සමාව අරන් ජේසුස් වහන්සේගේ ගැළවීම සැබෑ විදිහටම ලබා තියෙනවද? මේ වගේ දේවල් ගැන සිතිය යුතුමයි. ජේසුස් වහන්සේට පුලුවන් වුණා අපි වෙනුවෙන් හැම දෙයක්ම අත්හරින්න. දුක් විඳින්න. ඉතිං අපිට මෙච්චර ආදරය කරන ජේසුස් වහන්සේට අපෙන් විය යුතු දේ මොකද්ද? මේ ගැන පුංචි ඔයාලත් මේ නත්තලේදී හිතන්න. ඒ වගේමයි ජේසුස් වහන්සේ උන්වහන්සේගේ මුළු ජීවිත කාලයම වැය කළේ අන් අය වෙනුවෙන්. ඉතිං දුවේ පුතේ පුංචි ඔයාගෙනුත් ඔයාගේ පවුලට, සමාජයට වෙන්න තියෙන කොටසක් තියෙනවා. ඒ දේ කරන්න පසුබට වෙන්න එපා. ඒ වගේමයි අන් අයට හැමවිටම කරුණාවන්නත වෙන්න. උපකාර කරන්න. බේදීම් නැතිව හැමටම එක වගේ සළකන්න. අපි තෑගි බෙදා හදා ගන්න ඕනේ නත්තලට විතරක් නෙමෙයි. පුළුවන් හැම දවසකම අනිත් අයට උදව් උපකාර කරන්න. හැම විටම ජේසුස් වහන්සේ වගේ වෙන්න උත්සාහ කරන්න. ඉතිං මේ නත්තලේ ඔයාලට තියෙන අභියෝගය මේකයි. නත්තලේ සැබෑ අරුත දැනගෙන මේ නත්තල සමරමු. ඔයාලා හැම කෙනෙක්ටම ජේසු පිහිටයි.

**හංසිනී පෙරේරා නැන්දා**

# අඳුර දුරුකළ විශ්මිත උපත



2024 වර්ෂයේ විවිධ අභියෝග හා වෙනස්වීම් පසුකරමින් වර්ෂයේ අවසානය කරා එමින් සිටියි. නැවත අප හැරී බලන විට සුබවාදී හා අසුබවාදී අත්දැකීම් තුලින් අප ගමන් කළ බව සත්‍යයකි. මෙම වර්ෂයේ ඉතාමත් උත්කර්ෂවත් උත්සවය හෙවත් නත්තල සැමරීමට අපි සූදානමින් සිටිමු. නත්තල හා එහි සැඟවුනු චරිත හා සිදුවීම් ගණනාවක් සිදුවී ඇති බව නොරහසකි. ***"අන්ධකාරයෙහි ඇවිද්ද සෙනඟ මහත් ආලෝකයක් දුටුවෝය; සනඳුරු දේශයෙහි විසූ අය කෙරෙහි එළියක් දැන් බැබළෙන්නේය."*** (යෙසායා 9:2). ක්‍රි.පූ. 8 වන ශතවර්ෂයේ විසූ ශ්‍රේෂ්ඨ දිවැසිවරුන් අතරින් වැදගත් ස්ථානයක් ගත් යෙසායා දිවැසිවරයා විසින් දේව අභිමතය පරිදි ලොවට වඩින්නාවූ **"මෙසායා"** හෙවත් ගැළවුම්කරුවාණන් පිළිබඳව අනාවැකියක් ඉහත පවසා තිබේ.

මෙය දකුණු රාජ්‍යය හෙවත් ජුදාව බලවත් ජාතියක් වූ අසිරියාවෙන් ඇතිවූ තර්ජනයට මුහුණ පා සිටි කාලයයි. දේශපාලනමය තර්ජනයට වඩා බලවත් අධ්‍යාත්මික පිරිහීමක් ඇතිවී තිබෙන බව යෙසායා දිවැසිවරයා පෙන්වා දුන්නේය. සෙනග දෙවියන්වහන්සේට අකීකරුවී උන්වහන්සේ කෙරෙහි විශ්වාසය නොතැබීමේ හේතුවෙන් පාපයට වැටී සිටීමයි. මේ නිසා ජාතියේ පරිහානියක් විනාශයක් ඇතිවන බවට අනතුරු හඟවා, පවින් තොර යුක්තිගරුක, ධර්මිෂ්ඨ ජීවිත ගතකරන මෙන් මෙතුමා තවදුරටත් අවවාද කළේය. අනාගතයේදී ඇතිවන්නට යන මුළු ලෝකයේ සාමයත් දාවිත්ගේ රජුගේ වංශයෙන් පහළවන ආදර්ශවත් රජ කෙනෙකු ගැනත් ඔහු අනාවැකි ප්‍රකාශ කළේය.

ක්‍රිස්තු උපත යනු අහම්බෙන් හා මනුෂ්‍යය උවමනාවෙන් සිදුවූවක් නොව, සර්වපරාක්‍රම දෙවි සමිඳුන් අප ආදී පියවරුන් හට දුන් පොරොන්දුව ඉටුවීමයි. එය ශුද්ධ බයිබලයේ උත්පත්ති කථාවෙන් (උත්පත්ති 3:15) ආරම්භ වී පුරාණ ගිවිසුම් යුගය පුරාම විවිධ දිවැසිවරුන් ලවා සමිඳාණන් වහන්සේ මතක් කර දුන් සේක. යෙසායා දිවැසිවරයා විසින් අනාගත මෙසියස් තුමාගේ දිව්‍ය ගුණාංග ගණනාවක් මතක් කර දුන්නේය. ***"ගලීල දේශයට ගෞරවය පැමිණෙන්නේ"*** (යෙසායා 9:1) යනුවෙන් පළමුව පවසයි. ජේසුස් ක්‍රිස්තුස් සමිඳුන්ගේ පැමිණීම මුළු විශ්වයටම ගෞරවයකි. උන්වහන්සේ මෙලොවට වැඩම කළ විට පළමුව බැති ගී ගායනා කළ සුරදූතයෝ තම බැති ගී ගායනයෙන් එය පැහැදිලි කළහ. ***"අති උසස් තැන්හි දෙවිඳුන් හට මහිමය ද, මිහිපිට දේව ප්‍රසාදය ලත් ජනයා අතර සාමය ද වේවා".*** (ලූක් 2:14).

පාපයෙන් හා අධර්මිෂ්ඨකමෙන් දූෂිත වූ ලෝකයාට ජේසු සමිඳුන්ගේ උපත පව්කමාව ලබාගැනීමටත් නැවත බිඳී ඇති දේව සබඳතාවය ගොඩනඟා ගැනීමටත් ඇති එකම මාර්ගයයි. බැති ගී ගයන දේවස්ථාන හා අනෙකුත් කණ්ඩායම් විසින් මෙම සත්‍යය අවබෝධ කරගත යුතු අවස්ථාව මෙය බවද අමතක නොකරන්න.

***"අන්ධකාරයෙහි ඇවිද්ද සෙනඟ මහත් ආලෝකයක් දුටුවෝය; සනඳුරු දේශයෙහි විසූ අය කෙරෙහි එළියක් දැන් බැබළෙන්නේය ".*** (යෙසායා 9:2) .

අධ්‍යාත්මිකව අන්ධව ඇවිදින සෙනඟට මෙය මහත් බලාපොරොත්තුවක් ගෙනදෙයි. දෙවියන් වහන්සේ සැබෑවූ එකම ආලෝකය බවත්, අන් සියළු ආලෝක, ආලෝක ප්‍රභවයන් පමණක් බවත් අපි දනිමු.


තවද ජේසුස් වහන්සේ මෙම සැබෑවූ ආලෝකය වන සේක. උන්වහන්සේ සරණ යන්නෝ අන්ධකාරභාවයෙන් නිදහස ලබා, තම ජීවිත ආලෝකමත් කර බබලවා ගැනීමට උන්වහන්සේ ඔවුන්ට උපකාර කරන සේක.

*"අපට ළදරුවෙක් උපන්නේය. අපට පුත්‍රයෙක් දෙන ලද්දේය. එතුමාණෝ අපේ රජු වන සේක. එතුමාණෝ අසිරිමත් උපදේශකයාණෝය. ප්‍රතාපවත් දෙවි තුමාණෝය. සදාතන පියාණෝය. සාමයේ කුමාරයාණෝයයි කියනු ලබන සේක".*(යෙසායා9:6). *"මෙන්න කන්‍යාවක් ගැබ්ගෙන පුතෙකු බිහිකරන්නීය. උන්වහන්සේට එම්මානුවෙල් යන නාමය තබනු ඇත යනුය. එය නාමයේ අර්ථය නම් දෙවියන් වහන්සේ අප සමඟය යනුයි."* (මතෙව් 1:23).

***ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ සමග අර්ථාන්විතව මෙම විශ්මිත උපත සැමරීමට උන්වහන්සේ ඔබට උපකාර කරන සේක්වා !***

**කතෘ**

---




## දසපණත හා එහි පසුබිම

සීනයි කන්දේදී මෝසෙස්ට ලබා දී ඇති දස පණත, අද පවා ලෝකයේ සැලකිය යුතු බලපෑමක් පවත්වා ගෙන යයි. එය සදාචාරාත්මක මාර්ගෝපදේශනයකි. ආඥා මගින් මිනීමැරීම්, සොරකම් සහ බොරු කීම වැනි සදාචාරාත්මක හැසිරීම් සඳහා කාලානුරූපී මූලධර්ම සපයයි. මෙම මූලධර්ම බොහෝ නීති පද්ධති සහ සමාජ සම්මතයන් සඳහා පදනම්වේ. එය සදාචාරාත්මක මග පෙන්වීමක් ලෙස සේවය කරයි. ප්‍රජාවන් තුළ යුක්තිය, ගෞරවය සහ සමගිය ප්‍රවර්ධනය කරන තීරණ ගැනීමේදී පුද්ගලයන්ට මග පෙන්වයි.

ආගමික වැදගත්කම අනුව බොහෝ කිතුනුවන් සහ ජුදෙව්වන් සඳහා, දස පණත ඔවුන්ගේ ඇදහිල්ලේ හා භාවිතයේ කේන්ද්‍රීය අංගයකි. ඒවා මනුෂ්‍යත්වය සඳහා දෙවියන් වහන්සේගේ චරිතය සහ කැමැත්ත පිළිබිඹු කරන උන්වහන්සේගේ නීති ලෙස සලකනු ලැබේ. ග්‍රීක පිටපතෙහි ***'ඩෙකලොග්'*** ලෙස දස පණත සඳහන්වේ. හෙබ්‍රෙව් බයිබලයට අනුව, දෙවියන් වහන්සේ විසින් මෝසෙස්ට ලබා දුන් ගිව්සුම් ලේඛනයක් ලෙස පිළිගෙන ඇති, ආගමික හා සාදාචාරාත්මක උපදෙස් මාලාවක් ලෙස දස පණත පුරාණ ඉශ්රායෙලයේ ක්‍රියාත්මක වූයේය. එය බයිබලයේ කැපී පෙනෙන ලෙස කොටස් තුනකින් දක්නට ලැබේ. නික්මයාම 20:2-17, 34: 11-26 , ද්විතීය නීති සංග්‍රහය 5:6-21.

මෙහි සංස්කෘතික බලපෑමද වැදගත්ය. ආගමික සන්දර්භයන්ගෙන් ඔබ්බට, දස පණත බටහිර සංස්කෘතිය, කලාව, සාහිත්‍යය සහ දර්ශනය කෙරෙහි දැඩි ලෙස බලපෑමක් කර ඇත. සදාචාරය සහ ආචාර ධර්ම පිළිබඳ සාකච්ඡා වලදී ඒවා බොහෝ විට සඳහන්වේ.

මෙය පුද්ගලික පරාවර්තනය සම්බන්ධයෙන්ද වැදගත්ය. බොහෝ අය පුද්ගලික යහපැවැත්ම සඳහා මෙවලමක් ලෙස දස පණත භාවිත කරති. ලෝක ඉතිහාසයට සුබවාදී ලෙස මෙතරම් බලපෑමක් කළ වෙනත් ලේඛනයක් නැත. බටහිර ශිෂ්ටාචාරය ගොඩනැගීමේදී දස පණත විශාල සේවයක් කර තිබේ.

ජගත් මානව හිමිකම් ඇති කළ, කාන්තාවට සමාජයේ සමාන තත්වයක් ලබාදුන්, වහල්භාවය නැති කළ, පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ඇති කළ ශිෂ්ටාචාරයක් ඇති වීමට දස පණත මුල් විය. මෙම ආඥාව අවුරුදු තුන් දහසකට පෙර ලබාදුන් නමුත් අද දක්වාම ඒවා සමාජ සුබ සිද්ධියට අදාළ වී තිබේ.

ලෝකයේ කෲර පාලකයන්, හිංසාකාර රජයන් අවම කිරීමට මෙම ආඥා දහය ප්‍රමාණවත්ය. ලෝකයේ මිනී මැරුම් සහ සොරකම් නැති ලෝකයක් සිතේ මවා ගනිමු. එවැනි ලෝකයක යුධ හමුදා, පොලිසි සහ උසාවි අවශ්‍ය නොවේ. දස පණත අනුගමනය කරන්නේ නම්, මිනීමැරුමකට හෝ සොරකමකට හසුනොවී සිටිමින්, දරුවන්ට සහ කාන්තාවන්ට පවා දිවා රෑ දෙකෙහිම නිදහසේ සංචාරය කළ හැකිය. අසල්වාසීන්ගේ සම්පත් කෙරෙහි  ලොල්නොවන, දෙමාපියන්ට ගරු කරන, පවුල නමැති ඒකකය යහතින් ක්‍රියාත්මක වන , බොරු නොකියනු යන ආඥාව ආරක්ෂා කරන සමාජයක් සඳහා අවශ්‍යවන සියලු කාරණා මෙම උදාර ආඥා තුළ ඇත්තේය.

එහෙත් එක කොන්දේසියක් අමතක කළ නොහැකිය. දස පණත දී ඇත්තේ මනුෂ්‍ය සම්භවයක් ඇති අධිකාරියකින් නොවේ. එය දෙන ලද්දේ කිසියම් පුද්ගලයෙක්, රජයක්, රජෙක් හෝ ආන්ඩුවක් විසින් නොවේ. එය දුන්නේ, දෙවියන් වහන්සේ බව ආඥා දසය දක්වන කොටසට පෙර' දෙවියන් වහන්සේ කතා කොට මේ සියලු ආඥා වදාළ සේක. වහල්කමේ නිවාසය වූ මිසර දේශයෙන් නුඹ පිටතට ගෙනා සමිඳාණන් වහන්සේ මමය.' යයි සඳහන් කරන්නේය. ඒ නිසා මෙම ආඥා දුන්නේ කවුරුන්ද කියා ප්‍රශ්න කළ හැකිය. සරලව දක්වන්නේ නම්, දෙවියන් වහන්සේ මිනී මැරීම වැරදියයි කියා නැත්නම් මිනී මැරීම වරදක් වන්නේ නැත.

සමහරු දක්වන්නේ, දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසය නැතිව, යහපත් කෙනෙකු විය නොහැකිදැයි ප්‍රශ්න කරති. දෙවියන් විශ්වාස නොකරන යහපත් අයද සිටිති. දෙවියන් වහන්සේ විශ්වාස කරන අයහපත් අයද සිටිති. මම මිනී මැරීම නරක බව විශ්වාස කරමි. තවත් කෙනෙකු මට මෙය කියන්න අවශ්‍ය නැත යයි කිව හැකිය. අදේවවාදීයෙකු වුවද මිනීමැරීම නරක බව විශ්වාස කරන්නේය. එහෙත් දස පණත  නොදැන ඒ ක්‍රියාව වරදක් බව දන්නේ කෙසේද? එය වරදක් බව විශ්වාස කිරීම ප්‍රමානවත් නොවේ. එය වරදක් බව හදවතින්ම දැන ගැනීම අවශ්‍යය. දෙවියන් වහන්සේ නැති නම් හොඳ සහ නරක යන දෙකම හුදු පුද්ගලික විශ්වාසයන්ය. කඩ සාප්පු වලින් බඩු සොරකම් කිරීම නරක යැයි සමහරු විශ්වාස කරති. තවත් අය එය පිළිගන්නේ නැත. ඒ නිසා සදාචාරය, විශ්වාසය සහ මතයන් පමණක් බවට පත්වේ. සියලු සදාචාරයන් මතයන් සහ විශ්වාසයන් බවට පත්වේ.

මිනීමැරීම නපුරක් බව විශ්වාස කිරීම ප්‍රමාණවත් නොවේ. ඔබගේ විශ්වාසය බොහෝ දෙනෙක් අනුමත නොකරනවා විය හැකිය. මේ ගැන වැඩි දුර යාමට අවශ්‍ය නැත. නාසිවාදී රජය යටතේ මිලියන දහස් ගණන් ජනයා මරා දමනු ලැබීය. බොහෝ රටවල කැරලි ඇති වූ විට අමානුෂික ලෙස මිනිසුන් මහමග ඝාතනය කෙරුනි. එබැවින් හොඳ නරක ගැන මිනිසුන්ගේ මතයන් පිළිබඳව එතරම් බලාපොරොත්තු තැබිය යුතු නොවේ. රජයක හෝ දේශපාලඥයෙකු හෝ ජනප්‍රිය වීමට යන්නෙකු නිසා පහසුවෙන් නපුර වෙත ජනයා තල්ලු විය හැකිය. තම මතවාදය යොදා ,තමා කරන වරද වරදක් නොවේ යයි සාධාරණීයකරණය කොට පෙන්වීමට දේව ධර්මය, ආගමික මතවාදයන්ද යොදාගත හැකිය.

කෙනෙකු පුද්ගලිකව හොඳ නරක කුමක්දැයි වටහා ගනු ලැබුවත්, එම තැනැත්තාට දෙවියන් වහන්සේ අවශ්‍ය වන්නේය. හොඳ නරක කුමක්දැයි දන්නා බොහෝ දෙනා පවා නිරතුරුව වැරදි ක්‍රියා කරති. ඔවුන්ට එසේ කල හැක්කේ, කිසිවකු  ඔවුන්ගේ චර්යාව බලා සිටින්නේ නැතැයි සිතන බැවිනි. එහෙත් දෙවියන් වහන්සේ සියලු සදාචාරයේ නිර්මාතෘවරයා යයි විශ්වාස කරන්නේ නම් , දෙවියන් වහන්සේ නිරතුරුව අපගේ ක්‍රියා විමසන බව සිතට මතු වන්නේය.

**ඒ නිසා අදේවවාදියෙකු වුවද, දස පණතේ සදාචාරීය නීති අනුව ජීවත් විය යුතුවේ. මෙම ආඥා දෙවියන් වහන්සේ දුන් බව විශ්වාස කරන්නේ නම්, ලෝකය මීට වඩා යහපත් වන්නේය. ඒවා හුදු මතවාදයන් නොවන බවත් දෙවියන් වහනසේ දුන් බවත් සිතට ගන්නේ නම් ලෝකය මීට වඩා යහපත් වනු ඇත.**


අවුරුදු තුන් දහසකටත් අධික කාලයක් තුළ දස පණතට වඩා යහපත් ආඥා ලබා දී නැත. අනාගතයේ වුවද කිසිවෙක් ඉදිරිපත් කරන්නෙද් නැත. අතීතයේ අපගේ නීති සකස් වූ හින්දු නීති ඇති **'මනුස්මෘතිය'** හෝ **'නාදධර්ම ශාස්ත්‍රය'** හෝ වෙනත් හින්දු නීති පොත්වල ඇත්තේ.

බ්‍රහ්මණයාට එක නීතියක් සහ ශූද්‍රයාට තවත් නීතියකි. ඒවාහි දෙවිවරුන් රාශියක් විශ්වාස කරන නිසා , දෙවිවරුන්ට විවිධ නීති ඇත. එහෙත් එකම දෙවියන් වහන්සේ විශ්වාස කරන්නා ශක්තිමත් පදනමක සිටින්නේය.

**මහාචාර්ය පී. පී. වී. සෝමරත්න**

**(නූතන ඉතිහාසය පිළිබඳ කොළඹ විශ්ව විද්‍යාලයේ සිටි, ජ්‍යේෂ්ඨ කතිකාචාර්යවරයා වන මෙතුමා, කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ කිතුනු ඉතිහාසය හා දේවධර්මය පිළිබඳව පර්යේෂණ ආයතනය භාරව කටයුතු කරයි. )**

**එතුමාගේ දායකත්වයට ස්තුතිය පුද කරමු.**



## දෙවියන් වහන්සේ අප සමගය

**( 'එම්මානුවෙල් ' සංකල්පය ගැන බයිබලීය විග්‍රහයක්)**

මේ නත්තලේදී, වර්තමාන අර්බුදකාරී සහ අඳුරු සමාජ යථාර්ථය තුළ, අප තුළ පැන නගින ප්‍රශ්නයක් වන්නේ 'ඇත්තටම දෙවියන් වහන්සේ අප සමගද?' යන්නයි. ශුද්ධ බයිබලයේ නත්තලේ කතා පුවතේ එන ***'එම්මානුවෙල්'*** (දෙවියන් වහන්සේ අප සමගය) යනුවෙන් හැඳින්වෙන මෙසියස් තුමාගේ එනම්, ගැලවුම්කාරයාණන් වහන්සේගේ චරිතය සහ කාර්යය භාරය ගැන මෙනෙහි කිරීම ඉතා කාලෝචිත බව පැහැදිලිය. එය දෙවියන් වහන්සේ සහ දේව ජනතාව අතර සම්බන්ධතාව පිළිබිඹු කරන ගැඹුරු යථාර්ථයකි. හෙබ්‍රෙව් බසින් යෙදෙන ***''ඉම්මානු''*** (අප සමගය) සහ ***'එල්'*** ( දෙවියන් වහන්සේ) යන වදන් දෙකේ සුසංයෝගයකි. අප මෙය තේරුම්ගත යුත්තේ යෙසායා 7:14 හි දැක්වෙන 'මෙසියානික අපේක්ෂාව පිළිබඳ දිවැසිවර ප්‍රකාශනය පදනම් කරගෙනය.

## ඓතිහාසික පසුතලය

මෙම දිවැසි වැකියට පසුබිම වන්නේ, ක්‍රි.පූ. 8 වැනි සියවසේදී එනම්, ක්‍රි.පූ. 734 දී ඉශ්රායෙල් සහ පැරණි මැදපෙරදිග පැවති සමාජීය, දේශපාලනික සහ ආගමික තත්වයයි. සොලමන් රජතුමාගෙන් පසුව ඉශ්රායෙල් දේශය උතුරු රාජ්‍යය සහ දකුණු ජුදා රාජ්‍යය වශයෙන් දෙකඩව පැවතිනි. එකල අසිරියානු අධිරාජ්‍යයේ බලය ව්‍යාප්ත වෙද්දී සිරියාවේ රජ සහ උතුරු ඉශ්රායෙල් රාජ්‍යයේ රජ ඊට එරෙහිව පෙරමුණක් ගොඩනගා ඔවුන් හා එක්වීමට දකුණු රාජ්‍යයේ රජවූ ආහාස්ට ඇරයුම් කලහ. ආහාස් රජු එයට එකඟ නොවූ නිසා, ඔහුට එරෙහිව සටන් කිරීමට ඔවුන් දෙදෙනා තීරණය කල විට, යෙසායා දිවැසිවරයා ආහාස් රජුට ඔවදන් දුන්නේ, අසිරියානු අධිරාජ්‍යයාටවත් අනෙක් රජුන් දෙදෙනාටවත් බිය නොවී දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසයෙන් සිටින ලෙසයි.

**'පරීක්ෂාකාරීව, සන්සුන්ව, නිර්භයව, නොකැලඹී සිටින්න....නුඹේ විශ්වාසය ස්ථිර නොවේ නම්, නුඹේ පැවැත්ම ස්ථිර වන්නේ නැත.''** (යෙසායා 7: 4, 9). එහෙත් ආහාස් රජ යෙසායා දිවැසිවරයාගේ වදන් නොතකා අසිරියානු රජ හා එක්වීමට තීරණය කිරීම මේ පසුබිමයි. ඊට ප්‍රතිචාර දක්වමින් යෙසායා දිවැසිවරයා මෙසියස් තුමා දාවිත් රජ පෙළපතින් බිහිවීම පිළිබඳ ප්‍රකාශ කළේය. ( යෙසායා 7: 10-15 ).

## දිවැසිවර පණිවුඩයේ දේවධාර්මික දැක්ම

දෙවි සමිඳාණන් වහන්සේගෙන් පිහිට ඉල්ලන්නට, ලකුණක් ලබා දෙන ලෙස උන්වහන්සේගෙන් අයදින්නට දිවැසිවරයා ආහාස් රජුට ඔවදන් දුනි. ඊට ඔහු දුන් ප්‍රතිචාරය තුළ දිස්වන්නේ අවිශ්වාසයේ ආකල්පයයි. ඒ තුළ භක්තියේ සේයාවක් කිසිසේත් පෙන්නුම් නොකරයි.

එහෙත් යෙසායා දිවැසිවරයා අභීතව මානව සංහතියේ ගැලවීම සඳහා වූ දෙවියන් වහන්සේගේ මෙසියානික සැලැස්ම ඉදිරිපත් කරයි. **'බලන්න, කන්‍යාවක් පිළිසිඳගෙන පුත්‍රයකු බිහිකරන්නීය. එම්මානුවෙල් යන නම ඔහුට තබන්නීය.'** හෙබ්‍රෙව් පිටපතේ යෙදෙන ***'අල්මා'*** යන්න 'විවාහයට සුදුසු වයසේ තරුණියක්' යන්න හඟවයි. ඊට අනුරූපව ග්‍රීක පිටපතේ යෙදෙන ***'පර්තිනොස්'*** යන වදන 'කන්‍යාවක්' යන්න හඟවයි. මේ දිවැසිවරයෙහි සපිරීම පිළිබඳව මතෙව් ශුභාරංචි කතුවරයා උපුටා දක්වන්නේ ග්‍රීක පිටපතේ ඇති සඳහනයි. යෙසායා දිවැසිවරයාගේ අරමුණ වන්නේ, දාවිත් රජ පරපුරෙන් බිහිවන අනාගත මෙසියස් තුමා හෙවත් විමුක්තිදායකයාණන් පිළිබඳ නාතාන් දිවැසිවරයා මගින් දුන් දේව පොරොන්දුව සිහිපත් කිරීමය. ( 2 සාමුවෙල් 7: 11-16 ).

**''මම නුඹෙන් පැවත එන නුඹේම දරුවකු නුඹට පසු රජකමට නංවා ඔහුගේ රාජ්‍යයෙහි ඔහු ස්ථිර කරන්නෙමි.'' (12 පදය)**

'දරුවා' නොහොත් 'පුත්‍රයා' ( හෙබ්‍රෙව් බසින් ***'යෙලෙද් '*** ) පිළිබිඹු කරන්නේ අනාගතයේදී මහා පෞරුෂත්වයකින් හා අධිකාරි බලයෙන් දේව රාජ්‍යය උදාකරන මෙසියස් තුමාණන්ගේ කාර්යය භාරයයි. එම දේව රාජ්‍යය සදාතණික ගුණාංගයෙන් යුක්ත වූවකි. (යෙසායා 9:6) එතුමා උදාකරන රාජ්‍යයෙහි සාමය, සහජීවනය, යුක්තිය සහ සාධාරණත්වය රජයන්නේය. ( යෙසායා 9:6, 11:3-5 ).

මෙසියස් තුමා මුල පුරන්නාවූ දේව රාජ්‍යයේ උදාව ප්‍රකාශ කරන්නේ මිනිස් ජීවිතයේ සැබෑ නවෝදයක් හා පරිණාමයක් යළි ඇති වීමයි.'එම්මානුවෙල් ' නාමය ( දෙවියන් වහන්සේ අප සමගය ) මෙසියස් තුමාණන්ගේ කාර්යභාරයේ පදනම සහ උත්තරීතර බව මැනවින් පසක් කරවයි.

බයිබලීය ලේඛන සම්ප්‍රදායන් තුළ කෙනෙකුගේ නාමය ඔහුගේ, ඇයගේ අනන්‍යතාවය සහ කැඳවීම හෙවත් කාර්යය භාරය පැහැදිලි කරයි. (උත්පත්ති17:5). මෙසියස් තුමාගේ කාර්යයභාරය වනුයේ, දෙවියන් වහන්සේ දේව ජනතාව සමග සිටින බව තම ගැලවීමේ ක්‍රියාදාමය තුළින් සාක්ෂාත් කිරීමයි. පාපය නිසා පළුදු වී ගිය දෙවි මිනිස් සබඳතාව යළි තහවුරු කිරීමයි. එනම්, දෙවි සමිඳාණන් වහන්සේ මනුෂ්‍යයා වෙත දක්වන අසීමිත දයා කරුණාවට ජනතාව අවදිකොට, යහපත් ජීවිත පැවැත්මකට ඔවුන් ඇතුළු කිරීමය. පුරාණ ගිවිසුමෙහි දේව ජනතාවගේ අධ්‍යාත්මිකත්වයේ වැදගත් කරුණක් වූයේ, ගිවිසුම් පැවැත්මයි. ( නික්මයාම 19:4-6, එසකියෙල් 36:28).

'එම්මානුවෙල්' ලෙස මෙසියස් තුමාගේ කාර්යයභාරය වන්නේ, දෙවි මිනිස් සබඳතාව සඳහා, ප්‍රඥාවේ මගට ජනතාව යොමු කිරීම බව යෙසායා දිවැසිවරයා අවධාරණය කරයි. එය 'යහපත' සහ 'අයහපත' අතර වෙනස ඉස්මතු කොට යහපත උදාකිරීම සඳහා නායකත්වය ලබා දීමයි.**''නපුර එපා කර යහපත තෝරා ගැනීමට තරම් ඔහුට තේරුම් පැහැදුම් ඇති වූ කළ ඔහු දී කිරිත් මී පැණිත් වළඳන්නේය.''** ....

දී කිරි සහ මී පැණි කාන්තාර පසුබිමක සශ්‍රීකත්වය සංකේතවත් කරයි. මෙසියස් තුමා තම අනාගත කාර්යය භාරය තුළින් ජනතාව යහමග යොමුකර ජීවිත නවෝදයක් උදාකිරීම මෙයින් පැහැදිළි වෙයි. ප්‍රඥාවේ මාර්ගයට පිවිසෙමින් පවිටු සහ අදමිටු පැවැත්ම අත්හැර දමා, දමිටු සහ යහපත් පැවැත්ම වැළඳ ගැනීම පලබර ජීවිතයකට නොවරදින පදනමයි. (ගීතාවලිය 1:1-3 ). '' දෙවියන් වහන්සේ අප සමගය.'' යන යථාර්ථය ප්‍රත්‍යක්ෂ වන්නේ, මෙසියස් තුමා පෙන්වා දෙන ප්‍රඥාවේ මාර්ගයේ ගමන් ගැනීමෙන් පමණය.

## ජේසු සමිඳු උපතින් සපිරෙන මෙසියානික පැතුම

මතෙව් ශුභාරංචියේ කතුවරයා තම දේව ධාර්මික චින්තනය ඔස්සේ, කිතු සමිඳුන්ගේ උපත තුලින් යෙසායා දිවැසිවරයාගේ මෙසියානික ප්‍රකාශනයේ සපිරීම පෙන්වා දෙයි. (මතෙව් 1: 22-23) මරිය තුමිය ශුද්ධාත්ම අනුහසින් පිළිසිඳ බිහි කළ ජේසු සමිඳාණන් මෙසියස් තුමාණන් එනම්, 'එම්මානුවෙල්' වන බව පෙන්වයි.

මෙය ජේසු සමිඳාණන් වහන්සේගේ අනාගත දූත සේවාව පිළිබඳ ගැඹුරු හැඳින්වීමක් වෙයි. උන්වහන්සේගේ මෙසියානික දූත සේවාව මගින් 'දෙවියන් වහන්සේ අප සමගය' යන යථාර්ථය මිනිස් ජීවිතයෙහි ප්‍රත්‍යක්ෂ වීම පෙන්වයි. ජේසු සමිඳාණන් තම දූත සේවාව ආරම්භ කරන්නේ එනම්, දේව රාජ්‍යයේ උදාව ප්‍රකාශයට පත් කරන්නේ පරණ දිවියට සැබෑ පරිවර්ථනයකට ඇරයුම් කරමිනි.**''පසුතැවිලි වී සිත් හරවා ගන්න. දේව රාජ්‍යය ආසන්නය.''**(මතෙව් 4: 15 , මාක් 1: 15 ). පසුතැවිල්ල තුළින් අදමිටු මග අතහැර, දැමිටු මගට පිවිසීමෙන් දෙවියන් වහන්සේ තම ජීවිත තුළ වැඩ සිටීමේ ගැඹුරු යථාර්ථය අත්දැකීමට හැකිවන බව එම ඇරයුමෙන් සනාථවේ. ජේසුස් වහන්සේ ''දෙවි සමිඳුන් අප සමගය'' අත්දැකීමට යොමුවීම සඳහා ප්‍රායෝගීක උපදෙස් මාලාවක් කන්ද උඩ දේශනාවෙන් ඉදිරිපත් කරන සේක. (මතෙව් 5:1-7, 28). ලෞකික හා සාවද්‍ය ප්‍රතිපත්ති වලින් බැහැර වී, දේව රාජ්‍යයේ ප්‍රතිපත්ති වැළඳ ගැනීමේ අවශ්‍යතාවය මූලිකව අවධාරණය කරන සේක.

භාග්‍යවන්ත බව පිළිබඳ ප්‍රකාශයෙන්, සිතින් දිළිඳු වෙමින් දෙවිඳුන් මත යැපීම අදහස් කරයි. තවද, සංවේදී බව, ධර්මිෂ්ඨකමට ලැදියාව, දයාවන්ත බව, පිරිසිඳු සිත සහ සාමයට ලැදියාව ආදිය පැහැදිළි කරන්නේ, ආත්මාර්ථයෙන් බැහැරවී පරාර්ථකාමී ආකල්පයන්ගෙන් ජන ජීවිතය තුළ පුබුදුවාලීමයි. දේව රාජ්‍යයේ උදාව අන් අය වෙත ගෙන යාමට **''පොළවේ ලුනු''** සහ **''ලෝකයේ ආලෝකය''** වීමට ශ්‍රාවකයන්ට වගකීම පැවරෙන්නේ එම දැක්ම තුළය. (මතෙව් 5:13-16 ). අමනාප වූ සහෝදරයා සමග සමගි වී දේව වන්දනා පිළිවෙත් ඉටු කරද්දී දෙවිඳුන් සැබවින්ම අප අතර බව පැහැදිළි නොවන්නේද? සමාජයෙහි මුල් බැස ඇති පළිගැනීම සහ අනුන් විනිශ්චය කිරීමේ වැරදි ආකල්ප ඉවතලා සතුරන් හට මෙත් සිත් වඩවන විට ''දෙවි සමිඳුන් අප සමගය'' යන්න ප්‍රබලව ප්‍රකාශවේ.

**''එබැවින් ඔබගේ ස්වර්ගීය පියාණන් වහන්සේ සම්පූර්ණව සිටින්නාක් මෙන්, ඔබද සම්පූර්ණව සිටින්න.''** ( මතෙව් 5:48). අසහනය, අතෘප්තිය, අනාගතයට බිය සහ තනිකම නූතන සමාජයේ අත්දැකීම් ලෙස පැතිරෙද්දී අහසේ කුරුල්ලන් හා විලේ මානෙල් මල් පවා සුරකින දෙවියන් වහන්සේ ඉතා සෙනෙහසින් දිව්‍ය සංරක්ෂණය සලසමින් අප අතර සිටින බව ජේසුස් වහන්සේ ප්‍රායෝගීක දැක්මකින් අපට උගන්වන සේක. ( මතෙව් 6: 25-34)

## නත්තලේ අභියෝගය : අපි දෙවියන් වහන්සේ සමගද ?

මේ නත්තලේදී ''දෙවියන් අප සමගද? '' යන පැණය වෙනස්කොට ''අපි දෙවියන් වහන්සේ සමගද?'' යන පැණය ඇසිය යුතුය. වර්ථමාන සමාජය තුළ ඇති සමාජීය, ආර්ථික, දේශපාලනික, සංස්කෘතික සහ ආගමික ප්‍රවනතා සැබවින්ම අභියෝගදායකය. ආහාර හිඟය, භාණ්ඩවල අධික මිල, සෞඛ්‍ය පහසුකම් නැතිවීම, ඉන්ධන සහ විදුලිබල අර්බුදය අපට පෙන්වන්නේ අඳුරු සහ ඍනාත්මක දැක්මකි. ඒ අතර විරැකියාව, අධිකරණ ක්‍රියාවලියේ පිරිහීම, දේශපාලන ක්‍රියාදාමයේ දූෂිත අංග අනාගතය ගැන ප්‍රශ්න ජනිත කරවයි. මෙවර නත්තල උදාවන්නේ මෙවැනි පසුබිමකය.

මෙහිදී අප කළ යුතු මුඛ්‍ය කරුණ වන්නේ, ''එම්මානුවෙල්'' වන ජේසු සමිඳුන්ගේ විමුක්තිදායක පණිවිඩය වෙත අවධානය යොමු කිරීමයි. වටිනාකම් වියවුල්ව ඇති නූතන ලෝකයේ'' යහපත සහ අයහපත''අතර වෙනස පහදන ප්‍රඥාවේ මගට ජන ජීවිතය යොමු කරලීම අපගේ කාර්යභාරයයි. එය අපට ආකල්ප හා ගතිපැවතුම්වල පූර්ණ වෙනසකට අභියෝග කරමින් ඇරයුම් කරයි. ආත්මාර්ථය, ලාභ ඉපැයීමේ චේතනා, බල තන්හාව සහ පාරිභෝගිකවාදී ආකල්ප ආදී අයහපතේ බලවේග බැහැර කොට මානව ගරුත්වය, සහෝදර දයාව, යුක්තිය , සාධාරණත්වය සහ සත්‍යය ආදී යහපතේ බලවේග සමාජගත කළ යුතුව ඇත.''එම්මානුවෙල්'' වන මෙසියස් තුමාගේ සදහම් මග එයයි. පියවි ඇසට නොපෙනෙන දෙවියන් වහන්සේගේ වැඩ සිටීම මේ සමාජ යථාර්තයේ පරිවර්ථනය තුළින් අත්දැකීමට හැකිවන්නේ එමගින් පමණි. දෙවියන් වහන්සේ , ජේසුස් වහන්සේ තුළින් ජන ජීවිතය තුළ අනන්‍ය වන සේක.

**''මම සාගිනිව සිටියෙමි. ඔබ මට කන්නට දුන්නාහුය. ... මාගේ මේ සහෝදරයන්ගෙන් ඉතාම සුළු තැනැත්තාට වුවද එසේ කළා නම් එය කළේ මටය.''** ( මතෙව් 25: 35, 40). මේ නත්තලේදී එම්මානුවෙල් වන ජේසුස් වහන්සේගේ මග යමින් ''දෙවියන් වහන්සේ අප සමග'' බව අත්දකින්නට අපි දෙවියන් වහන්සේ සමග සිටීමට වෑයම් කරමු.

**ශුද්ධ ලියවිලි පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ගරු දයා වැලිකඩආරච්චි පියතුමා**

**එතුමාගේ දායකත්වයට ස්තූතිය පුද කරමු.**

කතෘ

දේවගැති

රෝහිත

ද සිල්වා




## ක්‍රිස්තෝත්පත්තිය හා බැඳුණු අන්වර්ථ නාමයන් හා ඒවායේ භූමිකා

අපි තවත් නත්තලකට පිවිස සිටින්නෙමු. නත්තලේ සැබෑ අරුත අපේ ජීවිතයට ළඟා කර ගන්නට අපි වෙහෙසෙන්නෙමු. ජේසු උපත, ක්‍රිස්තු උපත යනුවෙන් අපි හඳුන්වන, ජේසුස් වහන්සේ යන නාමය හා උන්වහන්සේ හඳුන්වන්නට ශුද්ධ ලියවිල්ලේ සඳහන් අනෙකුත් අන්වර්ථ නාමයන්ගේ, බයිබලීය හා ඓතිහාසික පසුබිම විමර්ශනය කිරීම කිතුනු අපගේ විශ්වාසය තහවුරු කිරීමට හේතුවේ. (ජේසුස් - හෙබ්‍රෙව් - යේෂුඅ) ජේසුස් යන නම, පුද්ගලික සහ සංඥා නාමයක් හැටියට බයිබලයේ භාවිතා වී ඇත. එය අද දවසේ නිමල් , කමල්, අමර, සාමා වැනි නමකි. ජේසුස් වහන්සේ ජීවත් වූ අවධියේ මේ නම ප්‍රචලිතව භාවිතාවූ නමකි. එහෙත් මේ නම හා ගැඹුරු අදහසක් තිබේ.

**'ඈ පුතෙකු බිහි කරන්නීය. උන්වහන්සේට ජේසුස් යන නාමය තැබිය යුතුය. මන්ද, සිය සෙනඟ ඔවුන්ගේ පාප වලින් මුදාලන්නේ එතුමාණෝය.'** (මතෙව් 1:21).

සමිඳාණන්ගේ දූතයා ජේසුස් යන සාමාන්‍ය නාමය හා ගැඹුරු ක්‍රියාදාමයක් සම්බන්ධ කරයි. පාපවලින් මුදාලීම එමගින් හැඟේ. එබැවින් ජේසුස්ගේ උප්පත්ති කාලයේ ජේසුස් යන නාමය සාමාන්‍ය නාමයක් බවට පත්වී තිබුනද,පුරාණ ගිවිසුමේ ඒ හා බැඳුනු අදහස් හා කාර්යයන් අපි සලකා බලමු. මේ නම පැන නැගී ඇත්තේ, ***'යාෂඅ'*** නම් හෙබ්‍රෙව් ක්‍රියා පදයෙනි. මෙහි මූලික අරුත වන්නේ, කරදරයෙන්, ව්‍යසනයෙන්, පීඩාවෙන් හා පාපයෙන් මුදා ගැනීමවේ. මේ සෑම අවස්ථාවකදීම මේ ක්‍රියා පදයේ උක්තය දෙවියන් වහන්සේය. කර්ම පදය දේව ජනතාවයි.මේ ක්‍රියා පද යොදාගෙන ඇති සමහර අවස්ථා නම්,

* නික්මයාම : ඉශ්රායෙල් ඔබ සමිඳු විසින් මිදූ කෙනෙකි. (33:29).

* දිවැසිවරුන් විසින් : එහෙත් ඉශ්රායෙල්වරු සමිඳුන් විසින් ගලවනු ලැබූහ. ( යෙසායා 45:17).

* විනිශ්චයකරුවන් : මිදියන්වරු අතින් ඉශ්රායෙල්වරුන් ගලවන්න නුඹ යවන්නේ මමය. (වීරාවලිය 6: 14).

* යුගාන්තයේ : ඒ කාලය පැමිණි විට ජුදාහි වැසියන් ගලවනු ලබන්නෝය. (ජෙරමියා 33:16).

මේ අනුව අප (යාෂඅ) ක්‍රියා පදය, ඉශ්රායෙල් ඉතිහාසයේ සෑම අදියරකම වාගේ දෙවිඳුන්ගේ මිදීමේ, ගැලවීමේ , විමුක්තියේ ක්‍රියාවන් විස්තර කරන්නට යොදා ඇති බව දකිමු. මතෙව් 1:21 හි ජේසුස් යන නාමයට කේන්ද්‍රගත වන්නේ,මේ අදහස් සමුදායන්ය. මේ නිසා කිතුනු අපි නත්තල තුටුපහටුවන, විනෝදය හා උත්කර්ශය ගෙනදෙන සංසිද්ධියක් ලෙස පමණක් නොව, අපගේ ආත්මීක ජීවිතයේ වර්ධනය සඳහා උපයෝගී කර ගත යුතුය.

### මෙසියස්, මෙසායා (මෂියාහ්)

මක්නිසාද ස්වාමීන් වන ක්‍රිස්තුස් නම් ගැළවුම්කාරයෙක් ඔබ හට දාවිත්ගේ නුවර අද උපන්නේය.(ලූක් : 2:11). මෙහි ගැළවුම්කාරයෙක් යන පදය ග්‍රීක් 'සෝමේර්'යන වචනයේ පරිවර්ථනයයි. මෙහි පුරාණ ගිවිසුම් පදනම අප කලින් විස්තර කළ (යාෂඅ) හෙබ්‍රෙව් පදයෙනි. මේ කොටසේදී අපගේ අවධානය යොමු වන්නේ , ක්‍රිස්තුස් යන නාමය වෙතයි.'ක්‍රිස්ටොස්'යනු ග්‍රීක අන්වර්ථ නාම පදයකි. එය හෙබ්‍රෙව් භාෂාවේ, අභිශේක ලත් තැනැත්තා යන්න අදහස් වන 'මෙසියස්', 'මෙසායා' යන අන්වර්ථ නාමයයි. සමහර ඉංග්‍රීසි බයිබල්වල (NRSV) CHRIST යන පදය MESSIAH කියාම යොදා ඇත. සිංහල බයිබල්වල 'මෙසියස්' යනුවෙන් සෘජුවම සඳහන් වනුයේ, ජොහාන් 1: 42 පදයේ පමණි.

**එතුමාගේ දායකත්වයට ස්තුතිය පුද කරමු.**

# සභා පුවත්



### 382 වැනි සභා සංවත්සරය

වර්ෂ 1642 ඔක්තෝම්බර් මස 6 වන දින ගාල්ලේදී පළමු රෙපරමාදු ජනවන්දනාව පැවැත්වූ බව වාර්ථාවේ. 2024 ඔක්තෝම්බර් මස 5 වන දින පස්වරු 5.00 ට බම්බලපිටිය රෙපරමාදු දේවස්ථානයේදී තෛයිභාෂාමය දේව මෙහෙය පැවැත්විය. **'සභා වර්ධනය සඳහා බලපෑමක් ඇති යාච්ඤාව'** යන තේමාව අනුසාරයෙන් වර්තමාන සභා නායක, ලක්මාල් විජේරත්න සභා පාලක තුමා විසින් දේශනය කරනු ලැබීය.

### රෙපරමාදු සභා ප්‍රතිසංස්කරණ ඉරුදින

2024 ඔක්තෝම්බර් මස 31 වන දින ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය රෙපරමාදු දේවස්ථානයන්හි විශේෂ මෙහෙයන් පැවැත්වූ බව වාර්ථාවේ. වර්ෂ 1517 ඔක්තෝම්බර් මස මහා ප්‍රතිසංස්කරණය ඇති වූ අතර, මෙම වර්ෂයට වසර 507ක් පිරුණි.

### ශ්‍රී ලංකා බයිබල් සංගමය / සල්පිල

2024 ඔක්තෝම්බර් මස 26 වන දින බයිබල් සංගමයේ වාර්ෂික සල්පිල වැල්ලවත්ත රෙපරමාදු සභා භූමියේදී පැවැත්විය. එහිදී විවිධ වෙළඳ කුටි , කිතුනු බයිබල් පොත් පත්, පටිගත කරණ ලද ගීත පට හා ආහාර වර්ග ආදිය ඉතා පහසු මිලට ගැනීම සඳහා විවෘතව තිබුනි

### 2023 සිංහල සභා ඉරිදා පාසැල් තෑගි ප්‍රදාන උත්සවය



මෙම උත්සවය ඔක්තෝම්බර් මස 31 වන දින බම්බලපිටිය දේවස්ථානයේදී පැවැත්වූ බව වාර්ථාවේ. සියලුම ඉරිදා පාසැල් ශිෂ්‍යයන් හා ගුරුවරු උදෙසා යාච්ඤා කරන්න.

### සිංහල පවුල් කඳවුර- 2024

.




**'පවුරු බිඳ දමා පවුල ගොඩනගමු"** යන තේමාව යටතේ රෙපරමාදු පවුල් කඳවුර ඉතා සාර්ථක ලෙස ජාඇල බ්‍රේක් ගෲප්හිදී අගෝස්තු මස අවසාන සතියේ පැවැත්වූ බව වාර්ථාවේ.



# සාමය සතුට පිරි
# සුබ නත්තලක් වේවා

**ස්තුතිය**

***දූතයා සඟරාව සඳහා ලිපි හා නිර්මාණ සපයා දුන් සැමටත් , අනෙකුත් ආකාරයෙන් උපකාර කළ සියලුම දෙනාටත් අපගේ ස්තුතිය පුද කරමු.***

**ආපසු**

සුභ අස්න ,

363,

**ගාලු පාර,**

**කොළඹ 06.**

**වෙත,**